ISBN 1391-0418

# ගොවි ජනතා


27 වෙළුම 2 වැනි කලාපය 2025 අප්‍රේල් - ජූනි

## කෘෂි සංචාරක කර්මාන්තය













කෘෂිකර්ම අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

මිල රු.100

# ගොවි ජනතා

27 වෙළුම 2 වැනි කලාපය 2025 අප්‍රේල් - ජූනි

ප්‍රධාන සංස්කාරක
මහාචාර්ය ඒ.එල්. සන්දික

උප ප්‍රධාන සංස්කාරක
ආචාර්ය එන්.පී.ජී. සමන්ත

සංස්කාරක මණ්ඩලය
අනූපා දිසානායක
තුෂාරා ධර්මවර්ධන

අධීක්ෂණය
එස්.ඒ.සී.යූ. සේනානායක

සංස්කාරක
ඩී.එම්. අසංකා ඉන්දීවරී දිසානායක

පිටු සැකසුම හා නිර්මාණය
ඒ.පී. උදේනි කරුණාරත්න

තොරතුරු හා සන්නිවේදන අංශය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

දුරකතන 0112696981, 0112698540-41
දිගුව 304
ඊමේල් director@harti.gov.lk

## පෙළගැස්ම

ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක කර්මාන්තයේ වර්තමාන තත්ත්වය සහ නව මානයන් 2-11

කෘෂි සංචාරක ව්‍යාපාරය සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින විභවය 12-15

ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ව්‍යාපාරයේ අවස්ථා සංවර්ධනය සහ සැලසුම් 16-22

කෘෂි සංචාරක ව්‍යාපාරය හා සබැඳි බෙලිහුල්ඔය නිම්නයේ සොඳුරු ගොවිපළ නවාතැන 23-27

කුළුබඩු වගාව සමඟ බැඳුනු කෘෂි සංචාරක ව්‍යාපාරය 28-33

කෘෂි - සංචාරක ව්‍යාරයේ සාර්ථක කතාවක්, දඹුල්ල ප්‍රදේශයෙන් 34-38




ප්‍රධාන සංස්කාරක

## මහාචාර්ය ඒ.එල්. සන්දික

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


## ප්‍රධාන සංස්කාරක සටහන....

ශ්‍රී ලංකාව පිළිබඳ ලෝක අවධානය යොමු වීමට බලපෑ හේතු අතර ඓතිහාසික වැදගත්කම පමණක් නොව, සොබා සෞන්දර්යයෙන් පිරිපුන් රටක් වීම ද, ජෛව විවිධත්වය අතින් සුවිශේෂී මට්ටමක පැවතීම ද විශේෂයෙන් සඳහන් කළ හැකි ය. එමෙන් ම, සංස්කෘතිය හා සංස්කෘතික උරුමයන් සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකාව ට අනන්‍යතාවයක් හිමි වේ.

ගස් - වැල්, ඇළ - දොළ, සතා - සිවුපාවා පමණක් නොව දේශීය ගොවිතැන් රටාව ද මේ සියල්ල හා බැඳී පවතී. ගමයි - පන්සලයි, වැවයි - දාගැබයි යන අතීත පාඨයෙන් හෙළයා ප්‍රකාශ කරන ලද්දේ මෙය මිසක් වෙන යමක් නොවේ. සොබා දහම ට සමීප ක්‍රියාකාරකම් මේ ඔස්සේ සිදු කෙරෙයි. මේ වන විට, මෙවන් දෑ පිළිබඳව විමසා බලන්නටත්, මේ හා සම්බන්ධ ක්‍රියාකාරකම් හි නිරත වීමටත් ලෝක මට්ටමේ අවධානය යොමු ව තිබේ.

මේ හේතුවෙන් ලෝක සංචාරක ව්‍යාපාරයේ මෑත කාලීන ප්‍රවණතාවක් වන්නේ කෘෂි සංචාරක ව්‍යාපාරය යි. මෙහි දී, ශ්‍රී ලංකාව වැනි රටක පවතින විභවතා දේශීය ආර්ථිකයට ප්‍රතිලාභ රැසක් අත්කර දීමට සමත්වනු නො අනුමාන ය. එමෙන් ම, ගොවි ප්‍රජාව ට ආදායම් උපයා ගැනීමේ කදිම අවස්ථා රැසක් මේ ඔස්සේ විවර වේ. වැඩිදුරටත් සඳහන් කරන්නේ නම්, දේශීය ගොවියාගේ ආදායම විවිධාංගීකරණය වන අතර ම කිසියම් දුරකට ස්ථාවර වීමක් ද සිදු වේ. අනෙක් අතට කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් විටින් විට මතුවන අලෙවි ගැටලුවලට ද මෙමඟින් කිසියම් ආකාරයක විසඳුමක් ලබාගත හැකි ය. ගොවිබිම ට පැමිණෙන සංචාරකයා ට නවාතැන් පහසුකම් සපයා දෙමින්, ගොවිබිමේ පවතින කෘෂි නිෂ්පාදන, අවශ්‍යතාවය අනුව සකසා සිතේ හැටියට පරිභෝජනයට අවස්ථා සලසාදීම ඔස්සේ ශ්‍රී ලාංකික ගොවිතැනට මෙන් ම ගොවි ප්‍රජාවටත් සරු හෙට දිනකට මඟ හෙළිවනු නිසැක ය.

මෙහි දී, රටක් ලෙස ශ්‍රී ලංකාව ට අවශ්‍ය අදාළ සම්පත් පවතින අතර වඩා වැදගත් වන්නේ ව්‍යවසායකත්වය හා කළමනාකරණයයි. ඊට ගොවි ප්‍රජාව සූදානම් කිරීම කඩිනමින් සුදකළ යුතු ය. ඒ සඳහා ආරම්භය රාජ්‍ය අංශයෙන් ලබාදිය යුතු යැයි විටෙක අපට සිතේ. එබැවින්, එකී කාර්යය සඳහා ශ්‍රී ලාංකික ප්‍රජාව මෙන් ම ගොවි ජනතාව සූදානම් කරවීමටත්, අදාළ දැනුම ලබාදීමටත් **'ගොවි ජනතා'** සූදානම් බැව් මෙහි සටහන් කරමු.

තව ද, මෙවර **'ගොවිජනතා'** කලාපයේ තේමාව ඒ වෙනුවෙන් වෙන් වේ. මෙහි පළවන ලිපි ඔස්සේ කෘෂි සංචාරක ව්‍යාපාරය ට අවතීරණ වීමට අපේක්ෂාවෙන් සිටින සැමට අවශ්‍ය මූලික දැනුම ලබාගත හැකි ය. එමෙන් ම, ඔබ මෙම කාර්යයෙ හි මේ වනවිට නියුක්ත ව සිටින අයෙකු නම් ඔබේ අදහස් හා අත්දැකීම් බෙදා හදා ගැනීමට **'ගොවිජනතා'** සූදානම් බැව් අවසන් වශයෙන් සටහන් කරමු.



# ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක කර්මාන්තයේ වර්තමාන තත්ත්වය සහ නව මානයන්



### ලොව වටා කෘෂි සංචාරක කර්මාන්තය

වර්තමාන ලෝකයේ සංචාරක කර්මාන්තය තුළ ක්‍රමයෙන් ජනප්‍රිය වන අංශයක් ලෙස කෘෂි සංචාරක කර්මාන්තය හැඳින්විය හැකි ය. සරල ව කෘෂි සංචාරක කර්මාන්තය යනු කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හා ගොවිපළ ජීවිතය පදනම් කරගත් අත්දැකීමක් සංචාරකයින් ට ලබාදීම යි. මෙමඟින් සංචාරකයින් ට කෘෂිකාර්මික ස්ථානවල සංචාරය කරමින් එහි ක්‍රියාකාරකම්වල නිරතවීම ට සහ ස්වාභාවික පරිසරය සමඟ සම්බන්ධවීම ට අවස්ථාව සලසයි.

පසුගිය දශක කිහිපය තුළ ලෝකය පුරා කෘෂි සංචාරක කර්මාන්තය, සීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගෙන සිටියි. විශේෂයෙන් ඉතාලිය, ප්‍රංශය, ස්පාඤ්ඤය, ජපානය වැනි රටවල මෙම කර්මාන්තය සාර්ථක ව ක්‍රියාත්මක වේ.

ඉතාලිය කෘෂි සංචාරක ව්‍යාපාරයේ පෙරමුණ ගෙන සිටින රටවල් අතර ඉහළින් ම පවතින රටකි. විශේෂයෙන් ටස්කනි (Tuscany), උම්බ්‍රියා (Umbria) සහ පීඩ්මොන්ට් (Piedmont) වැනි කලාපවල පරම්පරාගත වයින් (wine) වතු සංචාරකයින්ට විවෘත කිරීම තුළින් ආරම්භ වූ මෙම ක්‍රමය, දැන් ඉතාලිය පුරා පැතිර පවතී. එමඟින් සංචාරකයින් ට ගොවිපළවල නැවතී ප්‍රදේශයේ නිෂ්පාදිත ආහාර අනුභව කරමින්, වයින් රස බලමින් ගොවිපොළ කටයුතුවල නිරත වීමේ අවස්ථාව ලැබේ.

ප්‍රංශයේ බොර්දෝ (Bordeaux), බර්ගන්ඩි (Burgundy) සහ ෂැම්පේන්(Champagne) වැනි ප්‍රදේශවල ද කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් වයින් නිෂ්පාදනය වටා කේන්ද්‍රගත වී තිබේ. ප්‍රංශ ගොවිපොළ ජීවිතය අත්විඳිමින්, මිදි වතු වල සැරිසරමින්, වයින් රස බැලීමේ සැසි සඳහා සහභාගි වෙමින් සංචාරකයින් හට සිය විවේක කාලය ඵලදායී ලෙස ගත කිරීමට හැකියාව මෙමඟින් උදා වී තිබේ.

එක්සත් ජනපදය තුළ කැලිෆෝනියාවේ නාපා (Napa valley) සහ සොනෝමා මිටියාවත (Sonoma County) වයින් නිෂ්පාදනය කේන්ද්‍ර කරගත් ප්‍රසිද්ධ කෘෂි සංචාරක ගමනාන්තයන් වේ. උතුරු කැරොලිනා (North Carolina), වර්මොන්ට් (Vermont) සහ විස්කොන්සින් (Wisconsin) වැනි ප්‍රදේශ කෘෂි සංචාරක කර්මාන්තය තුළ කාබනික ගොවිපොළවල්, පශු ගොවිපොළවල් සහ මේපල් සිරප් නිෂ්පාදන කරනු ලබන කර්මාන්තශාලා සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.

ජපානයේ කෘෂි සංචාරක කර්මාන්තය අද්විතීය සාම්ප්‍රදායික කෘෂිකාර්මික භාවිතයන් සහ සුන්දර ගැමි සංස්කෘතිය මත පදනම් වී තිබේ. මෙය ප්‍රධාන වශයෙන් වී වගාව, තේ වගාව, වසාබි වගාව සහ අනෙකුත් දේශීය බෝග වටා කේන්ද්‍රගත වී පවතී. බොහෝ ගම්බද ප්‍රදේශවල, විශේෂයෙන් ම ෂිසුඔකා(Shizuoka), කියෝටෝ (Kyoto) සහ හොක්කයිඩෝ (Hokkaido) වැනි ප්‍රදේශවල, "නොහාකු" (Nohaku) හෙවත් ගැමි නිවාස සංචාරකයින්ට සත්කාරකත්වය සපයමින්, ඔවුන්ට නැවතී සිටීම ට, ගොවිපළ ජීවිතය අත්විඳීමට සහ සාම්ප්‍රදායික ජපන් ආහාර සකස් කිරීමට අවස්ථාව සලසයි.

### ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක කර්මාන්තය

කෘෂිකර්මාන්තය සහ සංචාරක කර්මාන්තය යනු ශ්‍රී ලංකාවේ වඩාත් වැදගත් කර්මාන්ත දෙකක් වන අතර මෙකී කර්මාන්ත රටේ ආර්ථිකය ට සහ සංස්කෘතික අනන්‍යතාවය ට සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම අංශ දෙකේ සංකලනයක් වන කෘෂි සංචාරක කර්මාන්තය, සංචාරකයන් හට කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල නිරත වීමට ඉඩ සලසන, සාම්ප්‍රදායික කෘෂිකාර්මික භාවිතයන් පිළිබඳ උගන්වන, ග්‍රාමීය භූ දර්ශනවල සොභා සුන්දරත්වය වීඳීමට ඉඩ ලබා දෙන අද්විතීය කර්මාන්තයකි.වර්ධනය වන මෙම කර්මාන්තය සංචාරකයන් ට සැබෑ ග්‍රාමීය අත්දැකීම් ලබා දීම පමණක් නොව, ගොවීන් ට සහ ග්‍රාමීය ප්‍රජාවන් ට නව ආදායම් අවස්ථා ද නිර්මාණය කරයි.

ක්‍රියාකාරී ගොවිපොළක හෝ කෘෂිකාර්මික පරිසරයක සිදුකරන ඕනෑම සංචාරක ක්‍රියාකාරකමක් කෘෂි සංචාරක කර්මාන්තය ට අයත් වේ. එය බෝග අස්වැන්න නෙළීම, සතුන් ට ආහාර දීම, කාබනික ගොවිතැන් ක්‍රම සහ සාම්ප්‍රදායික ආහාර පිළියෙළ කිරීම පිළිබඳ ඉගෙන ගැනීම දක්වා ගොවි ජීවිතය අත්දැකීමක් ලෙස අත්විඳීමට සංචාරකයින්ට අවස්ථාව සලසාදීමකි. වෙරළවල්, ඓතිහාසික ස්ථාන සහ නගර කෙරෙහි අවධානය යොමු කරන සාම්ප්‍රදායික සංචාරක ව්‍යාපාරයට වඩා, කෘෂි සංචාරක කර්මාන්තය ගම්බද පෙදෙස් කෙරෙහි අවධානය යොමු කරමින් සංචාරකයින් ට ස්වභාවධර්මය සහ ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ සම්බන්ධවීම ට ඉඩ සලස්වයි.



ප්‍රධාන වශයෙන් කෘෂි සංචාරක කර්මාන්තය මඟින් පහත සඳහන් මූලික කරුණු තුන ක්‍රියාත්මක විය යුතු වේ.

- සංචාරකයින් ට නැරඹීමට හා රසවිඳීමට යමක් පැවතිය යුතු ය, එනම්, ස්වභාවික පරිසරය, ගොවිපොළවල්, පලතුරු වතු, සතුන් සහ කුරුල්ලන් වැනි දෑ.
- කෘෂිකාර්මික වැඩ  සිදු කිරීම (අස්වනු නෙළීම, බීජ වැපිරීම, පැළ සිටුවීම) මසුන් ඇල්ලීම, ආහාර පිසීම, ගැමි ක්‍රීඩාවල නිරත වීම වැනි ක්‍රියාකාරකම් සංචාරකයින් ට විනෝදය සැපයීම සඳහා පැවතිය යුතු ය.
- මතක සටහන් ලෙස සංචාරකයින් ට මිල දී ගැනීමට සැකසූ ආහාර, ගොවිපොළෙන් ලබාගත් අස්වැන්න, අත්කම් වැනි භාණ්ඩ පැවතිය යුතු ය.

**ශ්‍රී ලංකාව තුළ කෘෂි සංචාරක කර්මාන්තයේ ඇති වැදගත්කම**

ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක කර්මාන්තයේ වැදගත්කම ආර්ථික ප්‍රතිලාභවල ට වඩා ඔබ්බට දිවෙන්නකි. සංචාරක කෘෂිකර්මන්තයේ විශාලත ම වාසිවලින් එකක් වන්නේ එය ගොවීන් ට විකල්ප ආදායම් මාර්ගයක් ලබාදීමයි. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය බොහෝ විට උච්ඡාවචනය වන වෙළෙඳපොළ මිල ගණන්, අවිනිශ්චිත කාලගුණය වැනි අභියෝගවල ට මුහුණ දෙයි. සංචාරක කෘෂිකර්මාන්තය ගොවීන් ට බෝග අස්වැන්නෙන් පමණක් නොව වෙනත් මාර්ගවලින් ද මුදල් උපයා ගැනීමට ඉඩ සලසයි. උදාහරණ ලෙස ගොවිපොළ නිෂ්පාදනවලින් සාදන ලද සාම්ප්‍රදායික ආහාර සංචාරකයින් ට පිළිගැන්වීම, අච්චාරු, කුළුබඩු, සහ අත්කම් වැනි නිවසේ සාදන ලද නිෂ්පාදන සංචාරකයින් ට  විකිණීම තුළින් අමතර ආදායමක් උපයා ගැනීමට ගොවීන්ට හැකි ය. මෙවැනි විවිධ අමතර ආදායම් මාර්ග ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට උපකාරී වන අතර බෝග අස්වැන්න මත පමණක් ඔවුන්ගේ යැපීම සීමා නො කරයි. තව ද, කෘෂි සංචාරක කර්මාන්තය ගොවීන්  සඳහා පමණක් නොව වෙනත් බොහෝ දෙනාට රැකියා අවස්ථා නිර්මාණය කරයි. ඒ අනුව, රියදුරන්, මාර්ගෝපදේශකයින්, සූපවේදීන්, පිරිසිදු කරන්නන්, ශිල්පීන්, සහ ඉදිකිරීම් කම්කරුවන් යන සියල්ලන්ට ම මෙමඟින් රැකියා අවස්ථා උදා කර දෙයි.

වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධානම ගැටලුවලින් එකක් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශ දක්වා තරුණ තරුණියන්ගේ සංක්‍රමණයයි. බොහෝ තරුණයෝ කෘෂිකර්මාන්තය ලාභදායී නොවන වෘත්තීය









මාර්ගයක් ලෙස දකිති. කෘෂි සංචාරක කර්මාන්තය ට මෙම අදහස වෙනස් කළ හැකි ය. තරුණයින් සාර්ථක ලෙස කෘෂි සංචාරක ව්‍යාපාරය ක්‍රියාත්මක වන ගොවිපොළවල් දුටු විට, කෘෂිකර්මාන්තයේ රැඳී සිටීමට පෙළඹෙනු නො අනුමාන ය.

සංචාරක කෘෂිකර්මාන්තය හරහා, ශ්‍රී ලංකාව ට එහි පොහොසත් කෘෂිකාර්මික ඉතිහාසය ලෝකය ට පෙන්වීමට අවස්ථාව සැලසෙයි. උදාහරණයක් ලෙස, සංචාරකයින් ට 'අලුත් සහල් මංගල්‍යය' වැනි පැරණි උත්සව හෝ සාම්ප්‍රදායික අස්වනු නෙළීමේ චාරිත්‍රවල ට සහභාගී විය හැකි ය. ඔවුන් ට සැබෑ ශ්‍රී ලාංකික ආහාර පිසීමට, සාම්ප්‍රදායික ඇඳුම් ඇඳීමට සහ ජනශ්‍රැති නැටුම් හා ගීත පවා ඉගෙන ගත හැකි ය. එවැනි දෑ අත්විඳින විදේශීය සංචාරකයින් බොහෝ විට ඔවුන්ගේ අත්දැකීම් සමාජ මාධ්‍ය සහ සංචාරක වීඩියෝ හරහා ලොව පුරා බෙදා හැරීමට කටයුතු කරනු ලබයි. මෙම ගෝලීය නිරාවරණය තුළින් විදේශ සංචාරකයින් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගනිමින් රටේ ප්‍රතිරූපය සහ කෘෂි සංචාරක කර්මාන්තය ලොව පුරා ජනප්‍රිය කළ හැකි ය.

කෘෂි සංචාරක කර්මාන්තය සිසුන්, පර්යේෂකයින් සහ ගොවීන් සඳහා ද ශක්තිමත් අධ්‍යාපනික ප්‍රතිලාභ ළඟා කරයි. පාසල් දරුවන් සඳහා ගොවිපොළවල් වෙත අධ්‍යාපනික චාරිකා ක්‍රියාත්මක කිරීම තුළින් කෘෂිකර්මාන්තය පිළිබඳ න්‍යායාත්මක දැනුමට එහා ගිය ප්‍රායෝගික දැනුමක් ලබා දිය හැකිය. තව ද මෙතුළින් විශ්වවිද්‍යාල සහ කෘෂිකාර්මික ආයතන සඳහා ද ප්‍රතිලාභ ලැබේ. ඊට අමතර ව, ගොවීන් හට ලෝකයේ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන සංචාරකයින් සහ වෘත්තිකයින් සමඟ ගණුදෙනු කිරීමට අවස්ථාව සැලසීම තුළින් දැනුම සහ කෘෂි තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව උදා වේ.

**ශ්‍රී ලංකාව තුළ කෘෂි සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක වන ස්ථාන**

ශ්‍රී ලංකාව, එහි සශ්‍රීක භූමි, ඉපැරණි සංස්කෘතික උරුමයන් සහ ගැමි ජීවිතයේ සම්ප්‍රදායයන් සමඟ කෘෂි සංචාරක කර්මාන්තය සඳහා සුවිශේෂී ගමනාන්තයක් බවට පත්ව තිබේ. දිවයින පුරා ආකර්ෂණීය ලෙස කෘෂි සංචාරක කාර්මාන්තය ක්‍රියාත්මක වන ස්ථාන රැසක් විසිරී පවතින අතර, එමඟින් සංචාරකයින් ට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික උරුමය, සංස්කෘතික සම්ප්‍රදායන් සහ ස්වභාවික සුන්දරත්වය අත්විඳීමට අවස්ථාව සලසයි.

**ගන්නෝරුව කෘෂි තාක්ෂණික උද්‍යානය**

මහනුවර නගරයට ආසන්න ව පිහිටා ඇති ගන්නෝරුව කෘෂි තාක්ෂණික උද්‍යානය ශ්‍රී ලංකාව තුළ වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ කෘෂි සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක වන ස්ථානයක් වශයෙනි. මෙම සජීවී උද්‍යානය දේශීය හා විදේශීය යන

සංචාරකයින් දෙපිරිසට ම කෘෂිකර්මාන්තය පිළිබඳ ආකර්ෂණීය හා අද්විතීය අත්දැකීමක් ලබා දෙයි.

විවිධ පලතුරු, එළවළු, ඖෂධීය පැළෑටි සහ කුළුබඩු වගා කර ඇති අලංකාර වගා බිම් මෙහි දැකගත හැකි ය. තව ද, වී වගාව, තේ වගාව වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි බෝග වගා කරන ආකාරය පිළිබඳව ද මෙහි දී අවබෝධයක් ලබාගත හැකි අතර නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් සිදුකරන කෘෂිකාර්මික පර්යේෂණ පිළිබඳව ද අවබෝධයක් ලබාගැනීමට හැකිවීම මෙම උද්‍යානයේ ඇති තවත් විශේෂත්වයකි.

**චමල් රාජපක්ෂ කෘෂි තාක්ෂණ හා සංචාරක උද්‍යානය**

බටඅත පිහිටි චමල් රාජපක්ෂ කෘෂි තාක්ෂණ හා සංචාරක උද්‍යානය ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ක්ෂේත්‍රයේ නැඟී එන තවත් සුවිශේෂී ස්ථානයකි. එය කෘෂිකර්ම තාක්ෂණය සහ සංචාරක අත්දැකීම් එකට මුසු කරමින් සංචාරකයින් ට අද්විතීය අත්දැකීමක් ලබා දෙයි. මෙහි දී, නවීන කෘෂිකාර්මික ක්‍රමවේදයන් නිරීක්ෂණය කිරීමටත්, විවිධ බෝග වගා කරන ආකාරය ඉගෙන ගැනීමටත්, ගොවිපොළ ජීවිතයේ සුන්දරත්වය විඳ ගැනීමටත් සංචාරකයින්ට අවස්ථාව උදා වේ. එමෙන් ම, දේශීය ආහාරවල රස බැලීමට සහ ගොවිපොළෙන් සෘජුව ම ලබාගත් නැවුම් නිෂ්පාදන මිල දී ගැනීමට ද හැකියාව පවතී.

**අඹේවෙළ කිරි ගොවිපළ**

අඹේවෙළ කිරි ගොවිපළ යනු ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ක්ෂේත්‍රයේ තවත් එක් කැපී පෙනෙන ස්ථානයකි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි මෙම ගොවිපළ, නවසීලන්තයේ සුප්‍රසිද්ධ කිරි ගොවිපළවල ආකෘතියට අනුව නිර්මාණය කර ඇත. සංචාරකයින් ට ගොවිපොළ තුළ සංචාරය කිරීමෙන් කිරි දෙවීමේ ක්‍රියාවලිය නැරඹීමට, කිරි එකතු කිරීමේ සහ පිරිසැකසුම් ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට, එළදෙනුන් ට ආහාර ලබා දීම හා නවීන සැකසුම් තාක්ෂණය දැක බලා ගැනීමට අවස්ථාව ද ලැබේ. තව ද මෙම කිරි ගොවිපළ මඟින් උසස් තත්ත්වයේ චීස්, යෝගට් සහ අයිස්ක්‍රීම් වැනි කිරි ආශ්‍රිත නිෂ්පාදන සකස් කරන අතර සංචාරකයින් ට මෙම නිෂ්පාදන රසවිඳීමට ද හැකි ය.

**පරිසර හිතකාමී හෝටල් පද්ධති**

පරිසර හිතකාමී හෝටල් කෘෂි සංචාරක ක්ෂේත්‍රයේ දියුණුව ට සැලකිය යුතු දායකත්වයක් සපයයි. මෙම හෝටල් ස්වභාවික පරිසරය කේන්ද්‍ර කර ගනිමින් සංචාරකයින්ට සාම්ප්‍රදායික කෘෂිකාර්මික භාවිතයන් සහ ස්වභාවික සම්පත් සමඟ සබැඳි අත්දැකීම් ලබා දෙයි. විශේෂයෙන් ම මධ්‍යම කඳුකරයේ, දකුණු වෙරළබඩ සහ උතුරු මැද පළාත්වල පිහිටා ඇති මෙම හෝටල් හරිත සංචාරක කර්මාන්තය සඳහා ආදර්ශයන් බවට පත්ව තිබේ. සංචාරකයින් ට වී ගොවිතැන, එළවළු වගාව, කුළුබඩු වගාව හා සම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රමවේදයන් නිරීක්ෂණය කිරීමට සහ ඒවායේ නියැළීමට අවස්ථාව සැලසෙන අතර සංචාරකයින් ට දේශීය වගාකරුවන් සමඟ සම්බන්ධ වී කාබනික ගොවිතැන් ක්‍රම ඉගෙන ගැනීමට සහ සම්ප්‍රදායික ආහාර පිසීමේ ක්‍රම පිළිබඳ දැනුවත් වීමට ද අවස්ථාව උදා වේ.

මෙයට අමතර ව මධ්‍යම කඳුකරයේ, නුවරඑළිය හා හපුතලේ වැනි ප්‍රදේශවල පිහිටි සුප්‍රසිද්ධ තේ වතු ශ්‍රී ලංකාව තුළ සංචාරක ආකර්ෂණය දිනා ගන්නා ස්ථාන වේ. පීඩ්‍රෝ තේ වත්ත (Pedro) සහ මැක්වුඩ්ස් තේ වත්ත (Mackwoods) වැනි ස්ථාන සංචාරකයින් ට තේ දළු නෙළීමේ සිට අවසන් නිෂ්පාදනය දක්වා සම්පූර්ණ තේ නිෂ්පාදන ක්‍රියාවලිය නැරඹීම ට අවස්ථාව සලසයි.

තිස්සමහාරාමය සහ හම්බන්තොට යන ප්‍රදේශ සුවිශේෂී කෘෂි සංචාරක ස්ථාන ලෙස දකුණු පළාත තුළ මතුවෙමින් පවති යි. වියළි කලාපීය කෘෂිකර්මාන්තය සඳහා ප්‍රසිද්ධ මෙම ප්‍රදේශ සංචාරකයින් ට සාම්ප්‍රදායික හේන් ගොවිතැන් ක්‍රම අත්විඳීමට ඉඩ සලසයි.

අනුරාධපුර සහ පොළොන්නරුව වැනි ඓතිහාසික දිස්ත්‍රික්කවල, පුරාතන වාරි කෘෂිකර්මාන්තය පාදක කර ගනිමින් සංචාරක ව්‍යාපාරය දියුණු වෙමින් පවතී. තිසා වැව සහ පරාක්‍රම සමුද්‍රය වැනි පුරාතන ජලාශ අවට, සංචාරකයින් ට සාම්ප්‍රදායික වී වගාව සහ වාරිමාර්ග තාක්ෂණය අත්විඳීමට අවස්ථාව ලැබෙන කෘෂිකාර්මික සංචාරක ව්‍යාපෘති දැකිය හැකි ය.

**ශ්‍රී ලංකාව තුළ කෘෂි සංචාරක කර්මාන්තය සඳහා ඇති විභවතාවය**

සිය අනන්‍ය භූගෝලීය පිහිටීම, විවිධාකාර දේශගුණික කලාප, සරුසාර භූමිය සහ පොහොසත් කෘෂිකාර්මික උරුමය හේතුවෙන් කෘෂි සංචාරක කර්මාන්තය සඳහා අති විශාල විභවයක් ශ්‍රී ලංකාව තුළ පවතී. වසර දෙදහස් පන්සියයකට වඩා පැරණි කෘෂිකාර්මික ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකාව තුළ සංචාරකයින්ට අනර්ඝ අත්දැකීම් ලබා දීමට හැකි සම්පත් රාශියක් හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ඇති තේ වතු කෘෂි සංචාරක කර්මාන්තය සඳහා ඉතා සුදුසු පරිසරයකි. නුවරඑළිය, බදුල්ල, හැටන් වැනි ප්‍රදේශවල තේ වතු ආශ්‍රිත කෘෂි සංචාරක ව්‍යාපෘති ආරම්භ කිරීමෙන් විදේශීය සංචාරකයින් ට තේ දළු නෙළීම, තේ නිෂ්පාදන ක්‍රියාවලිය නැරඹීම, සහ තේ රස බැලීම වැනි අත්දැකීම් ලබාදිය හැකි ය.



ශ්‍රී ලංකාවේ වී වගාව යනු ඈත අතීතයේ සිට පැවත එන ප්‍රධාන වගාවකි. වී වගාව ප්‍රමුඛ ව සිදු කරන අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර වැනි ප්‍රදේශවල කෘෂි සංචාරක ව්‍යාපෘති ආරම්භ කිරීමට හැකියාව පවතී. මෙහි දී, සංචාරකයින් ට ශ්‍රී ලංකාවේ වාරි සංස්කෘතියේ ඉතිහාසය, වී වගාවේ සියලු කෘෂි කාර්මික පිළිවෙත් (බිම් සැකසීම, වැපිරීම, අස්වනු නෙළීම, වී සැකසීම) සහ ගොවි ගම්මානවල සංස්කෘතියේ අත්දැකීම් ලබාගත හැකි කෘෂි සංචාරක ව්‍යාපෘති ආරම්භ කළ හැකි ය. සංචාරකයින් ට ගොවි නිවෙස්වල නවාතැන් ගෙන, වැව් ආශ්‍රිත ජීවන රටාව අත්විඳීමට අවස්ථාව ද මේ හරහා සැකසිය හැකි ය.




ශ්‍රී ලංකාවේ කුළුබඩු වගාව ද කෘෂි සංචාරක කර්මාන්තය සඳහා විශාල විභවයක් පවතින ක්ෂේත්‍රයකි. මාතලේ, මහනුවර, ගාල්ල, මාතර වැනි ප්‍රදේශවල කුරුඳු, ගම්මිරිස්, සාදික්කා, කරදමුංගු වැනි කුළුබඩු වගා කරන ගොවිපොළවල් කෘෂි සංචාරක කේන්ද්‍රස්ථාන බවට පත්කළ හැකි ය. සංචාරකයින් ට කුළුබඩු වගාව, ඒවා සැකසීම සහ ඒවායේ ඖෂධීය ගුණ පිළිබඳ දැනුම ලබාදීමට මෙන් ම කුළුබඩු ආශ්‍රිත ආහාර පිසීමේ හා සුවඳ විලවුන් සෑදීමේ වැඩමුළු ක්‍රියාත්මක කිරීමට ද මෙමඟින් හැකියාව ලැබේ.




ශ්‍රී ලංකාවේ පොල් වගාව ආශ්‍රිත කෘෂි සංචාරක ව්‍යාපාරය ද සංචාරකයින් අතර ජනප්‍රිය කර විය හැකි අංශයකි. විශේෂයෙන් වයඹ, දකුණු සහ බස්නාහිර පළාත්වල ද පොල් ත්‍රිකෝණය ලෙස හැඳින්වෙන ප්‍රදේශවල ද මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි ය. "පොල් ගම්මානය" නමින් කෘෂි සංචාරක මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමෙන් සංචාරකයින්ට පොල් ගස සහ එහි විවිධ උපයෝගීතා (පොල් තෙල්, කොහු, පොල් හකුරු, පාපිසි) පිළිබඳ දැනුම ලබාදීම සිදු කළ හැකි ය.



ශ්‍රී ලංකාවේ පලතුරු වගාව ද කෘෂි සංචාරක කර්මාන්තය සඳහා ඉතා සුදුසු බෝග වගාවකි . රටේ විවිධ ප්‍රදේශවල වගා කරන කෙසෙල්, අන්නාසි, පැපොල්, රඹුටන්, දොඩම්, දූරියන් වැනි පලතුරු වගාවන් ආශ්‍රිත ව කෘෂි සංචාරක ව්‍යාපෘති ආරම්භ



කිරීමට හැකියාව පවතී. එමඟින් සංචාරකයින් ට ශ්‍රී ලංකාවේ දේශීය පලතුරු වර්ග හඳුනාගැනීම, ඒවා වගා කරන ආකාරය, සහ විවිධ පලතුරු ආශ්‍රිත ආහාර/පාන වර්ග (පලතුරු සලාද, පලතුරු යුෂ, පලතුරු ආශ්‍රිත අතුරුපස) රස විඳීමට අවස්ථාව සලසා දිය හැකි ය. විශේෂයෙන් ස්ට්‍රෝබෙරි වගාව සහ ස්ට්‍රෝබෙරි නෙළීමේ අත්දැකීම (Strawberry picking) විදේශීය සංචාරකයින් අතර ඉතා ජනප්‍රිය විය හැකි ය.

ශ්‍රී ලංකාවේ එළවළු වගාව ද කෘෂි සංචාරක කර්මාන්තය සඳහා විශාල විභවයක් පවතින ක්ෂේත්‍රයකි. විශේෂයෙන් නුවරඑළිය, බණ්ඩාරවෙල, වැල්ලවාය වැනි ප්‍රදේශවල එළවළු වගාව ආශ්‍රිත කෘෂි සංචාරක ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි ය. එවැනි ව්‍යාපෘති හරහා සංචාරකයින් ට කාබනික එළවළු වගාව, සාම්ප්‍රදායික වගා ක්‍රම, සහ එළවළු ආශ්‍රිත ආහාර පිසීම පිළිබඳ දැනුම ලබාදිය හැකි ය.

ශ්‍රී ලංකාවේ හෙළ බොජුන් ආපනශාලා ජාලය ද කෘෂි සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ කළ හැකි වටිනා සම්පතකි. "ගම්බද ආහාර අත්දැකීම" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමෙන් සංචාරකයින් ට ශ්‍රී ලංකාවේ දේශීය ආහාර පිළිබඳ දැනුම ලබාදිය හැකි ය. මෙහි දී සංචාරකයින් ට බත් හා වියළි මාළු කෑම, පොල් රොටි සෑදීම, කිරිබත් පිසීම, කැකුළු හාල් ආශ්‍රිත ආහාර, විවිධ වර්ගයේ දේශීය ව්‍යංජන වර්ග පිසීම වැනි දේශීය ආහාර පිළියෙළ කිරීමේ ක්‍රියාවලියට සහභාගී වීමට අවස්ථාව සැලසේ.

තව ද, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගොවි ජීවිතය, විශේෂයෙන් ගැමි ජීවන රටාව, බොහෝ සංචාරකයින් සඳහා අලුත් අත්දැකීමකි. සීගිරිය, පොළොන්නරුව, සහ හබරණ වැනි පුරාවිද්‍යාත්මක ස්ථාන අවට ඇති ග්‍රාමීය ප්‍රදේශවල කෘෂි සංචාරක ව්‍යාපෘති ආරම්භ කිරීමෙන් සංචාරකයින් ට සාම්ප්‍රදායික ගොවි ජීවිතය අත්විඳින්නට සහ එකම ගමනේ දී පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීමට ද ඉඩ සැලසේ. සංචාරකයින් ට ග්‍රාමීය නිවෙස්වල නවාතැන් ගැනීමට, දේශීය ආහාර රසවිඳීමට සහ දෛනික ගොවිතැන් කටයුතුවල ට සහභාගී වීමට ද අවස්ථාව සැලසීමෙන් ශ්‍රී ලාංකීය සංස්කෘතිය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගත හැකි ය.

**කෘෂි සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග සහ අනාගත සංවර්ධනය සඳහා ගතහැකි ක්‍රියාමර්ග**

ඉහත සඳහන් කළ ආකාරයට ශ්‍රී ලංකාව යනු කෘෂි සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අති විශාල සම්පත් ප්‍රමාණයක් සහිත රටකි. කෙසේ වෙතත්, මෙම ක්ෂේත්‍රය තවමත් පූර්ණ වශයෙන් සංවර්ධනය වී නොමැති අතර එය සංවර්ධනය කිරීමේ දී විවිධාකාර අභියෝගයන් ට මුහුණ දීමට සිදු විය හැකි ය.

### ප්‍රතිපත්ති සහ නියාමන රාමුවේ දුර්වලතා

ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ක්ෂේත්‍රය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ විධිමත් ප්‍රතිපත්ති හා නියාමන රාමුවක් නොමැති වීමයි. කෘෂිකර්මාන්තය හා සංචාරක කර්මාන්තය ඒකාබද්ධ කරන මෙවැනි නව ක්ෂේත්‍රයක් සඳහා පැහැදිලි මාර්ගෝපදේශ හා රෙගුලාසි අවශ්‍ය වේ. ප්‍රතිපත්ති රාමුවක් නොමැතිවීම නිසා කෘෂි සංචාරක ව්‍යාපාර ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන ගොවීන් ට හා ව්‍යවසායකයින් ට බලපත්‍ර ලබා ගැනීම, භූමිය භාවිතය හා රක්ෂණ කටයුතු පිළිබඳ ප්‍රශ්න රාශියක ට මුහුණදීමට සිදු වේ. සංචාරක අමාත්‍යාංශය හා කෘෂිකර්ම අමාත්‍යාංශය අතර ඵලදායී සම්බන්ධීකරණයක් නොමැතිවීම නිසා කෘෂි සංචාරක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අනවශ්‍ය ප්‍රමාදයන් හා පරස්පරතා ඇති වේ. මෙම අභියෝග ජය ගැනීම ට නම්, රජය විසින් කෘෂි සංචාරක ක්ෂේත්‍රය සඳහා විශේෂිත ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම හා අදාළ අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.

### මූල්‍ය ප්‍රවේශය හා ආයෝජන සීමා

ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ව්‍යාපාර ආරම්භ කිරීම ට හෝ වැඩිදියුණු කිරීම ට බලාපොරොත්තු වන ගොවීන් හා ව්‍යවසායකයින් මුහුණ දෙන තවත් ප්‍රධාන අභියෝගයක් වන්නේ මූල්‍ය ප්‍රවේශය සඳහා ඇති අවස්ථාවන් සීමිත වීමයි. වාණිජ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන කෘෂි සංචාරක ව්‍යාපෘති සඳහා ණය ලබාදීමට මැලිකමක් දක්වන අතර ඒවායේ අවදානම් ස්වභාවය හා ආපසු ගෙවීමේ කාලසීමාව පිළිබඳ අවිනිශ්චිතතාවයන් නිසා ඉහළ පොලී අනුපාතයක් ද අය කරයි.



සුළු හා මධ්‍යම පරිමාණ ගොවිපොළවල් සඳහා සංචාරක පහසුකම් ඉදිකිරීම, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සහ ආගන්තුක සත්කාරක පුහුණුවීම් ලබා ගැනීම වැනි කටයුතු සඳහා සැලකිය යුතු මූල්‍ය ආයෝජනයක් අවශ්‍ය වේ. එබැවින්, කෘෂි සංචාරක ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂා කරන බොහෝ ගොවීන්ට මූල්‍යමය බාධාවන් හේතුවෙන් තම අදහස් ක්‍රියාත්මක කිරීමට නො හැකි වේ. කෘෂි සංචාරක ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රම, සහනාධාර හා බදු සහන ලබාදීම මඟින් මෙම අභියෝගය ජය ගත හැකි ය. තව ද, පෞද්ගලික-රාජ්‍ය හවුල්කාරිත්වය මඟින් ගොවිපොළවල් හා කෘෂිකාර්මික ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද මේ සඳහා විසඳුමක් විය හැකි ය.

### තාක්ෂණික දැනුම හා කුසලතා හිඟය

බොහෝ ශ්‍රී ලාංකික ගොවීන් සම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රම භාවිතා කරන අතර සංචාරක කර්මාන්තය පිළිබඳ අවබෝධය හා අත්දැකීම් සීමිත වේ. කෘෂි සංචාරක ව්‍යාපාර සාර්ථකව පවත්වාගෙන යාම සඳහා සංචාරක කළමනාකරණය, අලෙවිකරණය, ඩිජිටල් මාධ්‍ය හා ආගන්තුක සත්කාර කිරීම වැනි ක්ෂේත්‍රවල දැනුම හා කුසලතා අවශ්‍ය වේ. මෙම දැනුම හා කුසලතා හිඟය නිසා කෘෂි සංචාරක ව්‍යාපාර ආරම්භ කිරීම හෝ සාර්ථකව පවත්වාගෙන යාම අභියෝගාත්මක වී තිබේ.

තව ද, ඩිජිටල් තාක්ෂණය, වෙබ් අඩවි නිර්මාණය, සමාජ මාධ්‍ය භාවිතය, හා මාර්ගගත (Online) වෙන්කිරීම් පද්ධති වැනි නවීන තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ සීමිත දැනුම නිසා ද ගොවීන් ට තම කෘෂි සංචාරක ව්‍යාපාර වඩාත් පුළුල් පාරිභෝගික පිරිසකට ප්‍රවර්ධනය කිරීමට අපහසු වේ. මෙම





අභියෝගය ජය ගැනීමට, කෘෂි සංචාරක කළමනාකරණය, අලෙවිකරණය හා ඩිජිටල් තාක්ෂණය පිළිබඳ විශේෂිත පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ගොවීන් හා සංචාරක වෘත්තිකයින් අතර දැනුම හුවමාරු කර ගැනීමේ වේදිකා නිර්මාණය කිරීම, සහ නවීන තාක්ෂණය භාවිතයට උපකාර වන මාර්ගෝපදේශ සැපයීම වැදගත් වේ.

**යටිතල පහසුකම් හා ප්‍රවාහන ගැටලු**

ශ්‍රී ලංකාවේ බොහෝ කෘෂිකාර්මික ප්‍රදේශ දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල පිහිටා ඇති අතර මෙම ප්‍රදේශවල ට ප්‍රවේශවීම ට ඇති මාර්ග පහසුකම් දුර්වල තත්ත්වයක පවතී. කෘෂි සංචාරක ව්‍යාපාර සඳහා පැමිණෙන සංචාරකයින් ට ප්‍රවාහන පහසුකම් සීමිතවීම, සමහර ප්‍රදේශවල විදුලිය හා ජලය සැපයුම් වැනි පහසුකම්වල ගැටලු පැවතීම සහ සන්නිවේදන පහසුකම් දුර්වලවීම වැනි යටිතල පහසුකම් ගැටලු නිසා කෘෂි සංචාරක ව්‍යාපාර සංවර්ධනය කිරීම අභියෝගාත්මක වේ.

තව ද, සංචාරකයින් ට ප්‍රමිතියෙන් යුත් නවාතැන් පහසුකම්, ආහාරපාන සේවා සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා ද මූලික යටිතල පහසුකම් අවශ්‍ය වේ. ග්‍රාමීය ප්‍රදේශවල මෙම පහසුකම් වැඩිදියුණු කිරීමට විශාල ආයෝජනයක් අවශ්‍ය වන අතර එය බොහෝ ගොවීන් ට දැරිය නො හැකි වියදමක් ද වේ.

ග්‍රාමීය මාර්ග පද්ධති, විදුලි හා ජල සැපයුම් සහ සන්නිවේදන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රජයේ ආයෝජන වැඩි කිරීම මඟින් මෙම අභියෝගය ජය ගත හැකි ය. එසේ ම, කෘෂි සංචාරක ගම්මාන සංකල්පය යටතේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සාමූහික ආයෝජන උත්සාහයන් දිරිමත් කිරීම ද ප්‍රයෝජනවත් විය හැකි ය.

**කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හා සම්බන්ධ අභියෝග**

ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ස්ථාන පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර සංචාරකයින් අතර දැනුවත්භාවය සීමිත වීම ද ප්‍රධාන අභියෝගයකි. සම්ප්‍රදායික සංචාරක ආකර්ෂණය දිනාගත් වෙරළ තීර හා සංස්කෘතික ස්ථාන සමඟ සසඳන විට කෘෂි සංචාරක ස්ථාන ප්‍රවර්ධනය කිරීම සඳහා අඩු අවධානයක් යොමු කරයි.

බොහෝ කෘෂි සංචාරක ව්‍යාපාර හිමියන් ට ඔවුන්ගේ සේවා හා අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම සඳහා සීමිත මූල්‍යමය සම්පත් හා දැනුමක් පවතී. ජාත්‍යන්තර සංචාරකයින් ඉලක්ක කර ගනිමින් ඵලදායී ප්‍රවර්ධන උපාය මාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ද අභියෝගාත්මක වේ.

මෙම අභියෝගය ජය ගැනීමට, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට (SLTPB) වැඩි වගකීමක් පවතී. ඔවුන් හරහා ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශන හා වෙළෙඳපොළවල කෘෂි සංචාරක ගමනාන්ත

ප්‍රවර්ධනය කිරීම, ඉලක්කගත වෙළෙඳපොළවල විද්‍යුත් හා මුද්‍රිත සංචාරක සඟරා හරහා ප්‍රවර්ධන ව්‍යාපාර දියත් කිරීම සහ සමාජ මාධ්‍ය හා ඩිජිටල් ප්‍රවර්ධන ක්‍රම භාවිතය වැඩි කිරීම සිදු කළ හැකි ය.

ඉහත සඳහන් කළ පරිදි ශ්‍රී ලංකාව තුළ කෘෂි සංචාරක ක්ෂේත්‍රය සඳහා විශාල විභවයක් පැවතිය ද, එය සංවර්ධනය කිරීමේ දී අභියෝග රාශියකට මුහුණදීමට සිදුව තිබේ. මෙම අභියෝග ජය ගැනීමට නම් රජය, පෞද්ගලික අංශය, ප්‍රජා සංවිධාන හා අධ්‍යාපන ආයතන අතර සහයෝගීතාව අත්‍යවශ්‍ය වේ. එවැනි සාමූහික ප්‍රයත්නයක් මඟින් ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ක්ෂේත්‍රය තිරසාර හා සමෘද්ධිමත් ලෙස සංවර්ධනය කිරීමට හැකි වේ. මෙකී සංවර්ධනය මඟින් ගොවීන් ට අමතර ආදායම් මාර්ග උත්පාදනය කිරීමටත්, ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික සංවර්ධනය ට දායක වීමටත්, සංචාරකයින් ට අද්විතීය හා සාම්ප්‍රදායික කෘෂිකාර්මික අත්දැකීම් ලබා ගැනීමටත් හැකියාව ලැබේ. තව ද, ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ක්ෂේත්‍රය නිසි නියාමනයන් හා දිරිගැන්වීම් සමඟ සංවර්ධනය කිරීම මඟින් රටේ කෘෂි සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීමටත්, හරිත සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ කීර්තිනාමය වැඩිදියුණු කිරීමටත්, තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමටත් උපකාරී වනු නිසැක ය.




**ආචාර්ය නිලූකා නාකන්දල**

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

බෝග විද්‍යා අධ්‍යනාංශය

කෘෂිකර්ම විද්‍යා පීඨය

රුහුණ විශ්වවිද්‍යාලය





**එන්.ජී.ඩී.බී. ජයසිරි**

**උපාධි අපේක්ෂිකා**

අවසන් වසර

කෘෂිපීඨය

රුහුණ විශ්වවිද්‍යාලය


**ගොවි ජනතා**

**ගොවි ජනතා සඟරාව පිළිබඳ ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සලකමු. එසේම, ඒවා ඉදිරි කලාපයන් හි පළ කිරීමට ද කටයුතු කෙරේ. එබැවින් එවැනි දෑ සංස්කාරක වෙත දන්වා එවන මෙන් පාඨක ඔබට ආරාධනා කරමු.**

**සංස්කාරක**
**ගොවි ජනතා**
**හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**
**114, විජේරාම මාවත,**
**කොළඹ 07.**




# කෘෂි සංචාරක ව්‍යාපාරය සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින විභවය



කෘෂිසංචාරක ව්‍යාපාරය යනු නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකරනු ලබන ගොවිපළවල් නැතහොත් කෘෂිපරිසර පද්ධති ආශ්‍රිත ව ඒ හා බැඳුණු ක්‍රියාකාරකම්වල නිරතවෙමින් කෘෂිකර්මාන්තය ආශ්‍රිත ජීවන රටාවේ අත්දැකීම් ලබා ගැනීම සඳහා දේශීය/ විදේශීය සංචාරකයින් හට ඉඩහසර ලබාදීමයි. මෙම ක්‍රියාවලිය තුළ ගොවිපළවල් නැරඹීම, ගොවිපළවල් තුළ ලැගුම් ගැනීම, සංචාරකයන් හට අවැසි පලතුරු සහ එළවළු නෙළා ගැනීම, ඔවුන්ගේ ආහාරවේල ඔවුන් විසින් ම සකසා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම, මී මැසි පාලනය, කොම්පෝස්ට් නිෂ්පාදනය සහ හතු වගාව ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරතවීම ට ඉඩ කඩ ලබාදීම, සම්ප්‍රදායික සහ දේශීය ආහාර වර්ග රස විඳීමට, දේශීය අත්කම්, සංගීතය සහ අනෙකුත් ජන ගායනා සහ ජන ක්‍රීඩා සඳහා සහභාගිවීමට අවස්ථාව ලබා දීම ආදිය දක්නට ලැබෙන අංගයන් වේ. ශ්‍රී ලංකාව සතු කෘෂිකාර්මික උරුමය, දර්ශනීය ග්‍රාමීය භූ දර්ශන, ජෛව විවිධත්වය සහ සංස්කෘතික ආකර්ෂණය හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ කෘෂි සංචාරක ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා සැලකිය යුතු විභවයක් පවතී.

- ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විචිත්‍රවත් භූ දර්ශනය සඳහා තේ, පොල්, කුරුඳු, ගම්මිරිස් සහ එනසාල් වැනි විවිධ කුළුබඩු වර්ග මෙන් ම වී වගාව ද ඉහළ දායකත්වයක් සපයයි. මධ්‍යම කඳුකරයේ තේ වතුවල සිට පහත් බිම්වල වී වගාවන් දක්වා ශ්‍රී ලංකාවේ විවිධ භූ දර්ශන පුළුල් පරාසයක පැතිරී පවතින බැවින් ඉහළ විවිධත්වයක් සහිත ව කෘෂිකාර්මික අත්දැකීම් රැසක් සංචාරකයින් සඳහා ලබාදීමේ හැකියාවක් පවතී. උදාහරණ ලෙස තේ කර්මාන්ත ශාලා ආශ්‍රිත ව සිදුකළ හැකි විද්‍යාත්මක තේ නිෂ්පාදනය පිළිබඳ නිරීක්ෂණ චාරිකාවන් සඳහා ඉහළ විභවතාවයක් පවතින අතර භාවිතයට නො ගෙන අත්හරින ලද තේ කර්මාන්ත ශාලා නවීකරණය කිරීම තුළින් සංචාරක නිවාඩු නිකේතන බවට පරිවර්තනය කර ගැනීමේ හැකියාව ලැබේ. තව ද, ලොව ප්‍රචලිත ශ්‍රී ලාංකික තේ සන්නාමය (Ceylon Tea) නිසා තේ රස බැලීමේ ආදර්ශන හඳුන්වාදීමට හැකියාවක් පවතී. මෙයට අමතර ව වී වගාව ආරම්භයේ දී සහ අස්වනු නෙළීමේ දී සිදුකරනු ලබන විවිධ චාරිත්‍ර - වාරිත්‍ර පිළිබඳ දැනුමක් සහ අත්දැකීම් ලබාගැනීම සඳහා උත්සව සංවිධානය කිරීමේ හැකියාව පවතී. ගොයම් පැළ සිටුවීම මෙන් ම, අස්වනු නෙළීම සඳහා සක්‍රිය දායකත්වයක් ලබාදීම තුළින් අත්දැකීම් ලබා ගැනීමට සංචාරකයින් හට ඉඩ සලසා දීමේ හැකියාව තිබේ. කමත ආශ්‍රිත ව සිදුවන ගොයම් පෑගීම මෙන් ම අලුත් සහල් මංගල්‍යය විදෙස් සංචාරකයින්ගේ සිත් ගත් ප්‍රධාන අංගයන් වේ.

- අඹ, කෙසෙල්, අන්නාසි, රඹුටන්, පේර සහ අනෝදා නිවර්තන කලාපීය පලතුරු විශේෂ සඳහා තෝතැන්නක් වූ ශ්‍රී ලංකාව දෙස් විදෙස් සංචාරකයින්ගේ නොමඳ ආකර්ෂණය දිනාගත් දිවයිනකි. තැඹිලි සඳහා විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය අද්විතීය වේ. එබැවින්, පලතුරු විශේෂ සඳහා වූ උද්‍යාන නිර්මාණය කිරීම මෙන් ම ඒ ආශ්‍රිත ව සිදුකරනු ලබන සැණකෙළි සහ අස්වනු නෙළීමේ සංචාර තුළින් විදේශ විනිමය උපයා ගැනීමේ ඉහළ විභවයක් පවතී. එක් එක් භෝග විශේෂ සඳහා උචිත දේශගුණික කලාප ආශ්‍රිත ව වගාව ට සුදුසු බිම් සපයා ගැනීමේ හැකියාවක් ද තිබේ.

- ශ්‍රී ලංකාවේ භූ විෂමතාවය සලකා බැලූ විට, එය මනස්කාන්ත දර්ශන නිර්මාණය කිරීමට සමත් වී තිබේ. මධ්‍යම කඳුකරය සහ එහි පිහිටීමත් ඒ ආශ්‍රිත ව ඇති සෞම්‍ය දේශගුණික තත්ත්වය සහ බෝග වගාව/ සත්ත්ව පාලනය සමඟ කැටිකොටගත් ස්වභාවික සෞන්දර්ය කෘෂිසංචාරක ව්‍යාපාරය සඳහා පුළුල් අවස්ථාවන් නිර්මාණය කර දෙනු ලබයි. එලෙස ම, උතුරු මැද පළාතේ වැව් ආශ්‍රිත ව සිදුවන මිරිදිය මත්ස්‍ය වගාව සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් මුල් කරගනිමින් කෘෂිසංචාරක ආදර්ශ ගම්මාන නිර්මාණය කිරීම සඳහා විභවයක් පවතී. මෙයට අමතර ව, වෙරළ ආසන්න ප්‍රදේශ මුල් කරගනිමින් ධීවර කර්මාන්තය ඇසුරින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තුළින් අත්දැකීම් ලබාගැනීම ට ඉඩකඩ ලබාදීම සිදුකළ හැකි වේ. උදාහරණයක් ලෙස වැලිගම සහ මිදිගම ප්‍රදේශයේ විශේෂයෙන් දක්නට ලැබෙන රිටි පන්න ගනිමින් මසුන් අල්ලන ධීවරයින් සමඟින් අත්දැකීම් බෙදා ගැනීමට විදේශ සංචාරකයින් දැඩි කැමැත්තක් දක්වනු ලබයි.

- ශ්‍රී ලංකාවේ කෘමි විශේෂවල විවිධත්වය සලකා බැලූ විට එය ඉතාම ඉහළ පරාසයක පැතිරී පවතී. ගොවිපළ සහ වගා බිම් ආශ්‍රිත ව හමුවන ස්වභාවික සතුරන්, පරපෝෂිතයින්, ශාක භක්ෂකයින් සහ පරාග කාරක කෘමීන්









හඳුන්වාදීම සහ කෘෂිකාර්මික පරිසර පද්ධති තුළ ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳව අධ්‍යාපනික වැඩසටහන් හඳුන්වා දීමේ හැකියාවක් ද තිබේ. ඔවුන්ගේ ජීවන චක්‍රය සහ ස්වභාවික වාසස්ථාන හඳුනාගැනීම ට එමඟින් ඉඩකඩ සැලසේ. මේ සඳහා කෘමි කෞතුකාගාර සහ පරාගකාරක කෘමීන් සහිත උද්‍යාන නිර්මාණය කිරීම ට අවශ්‍ය පාරිසරික සාධක ශ්‍රී ලංකාව තුළ හඳුනාගත හැකි ය. කෘත්‍රිම ව නිර්මාණය කළ කෘමි වාසස්ථාන (Insect hotels) හඳුන්වාදීම තුළින් අභිජනනය දිරිමත් කිරීම ඔස්සේ කෘමීන්ගේ තිරසර පැවැත්ම තහවුරු කිරීමේ හැකියාවක් ඇත. මෙයට කෘමීන් ආශ්‍රිත ව සිදුකරනු ලබන ලාක්ෂා සහ සේද නිෂ්පාදනය ආශ්‍රිත හස්ත කර්මාන්ත නඟා සිටුවීම තුළින් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ ඉහළ විභවයක් පවතී. ලාක්ෂා කර්මාන්තය මේ රට සාම්ප්‍රදායික දේශීය හස්ත කර්මාන්ත අතර ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. ලාක්ෂා නිෂ්පාදනය සඳහා මූලික අමුද්‍රව්‍ය වන්නේ ලාක්ෂා හෙවත් ලාකඩයි. මෙය දුම්මල වැනි ද්‍රව්‍යයක් වන අතර අතීතයේ දී මේවා සාදාගනු ලැබුවේ ලාක්ෂා (*Kerria lacca*) නම් කෘමි සතෙකු මාර්ගයෙනි. කෝන් සහ කැප්පෙටියා ආදී ශාක වර්ග කිහිපයක් ආශ්‍රිත ව මෙම කෘමියා දක්නට ලැබේ. මෙම කෘමියා විසින් ලාකිරි නැමැති රෙසීනය නිෂ්පාදනය කරනු ලබන අතර සංකීර්ණ ක්‍රියාවලියක් අවසානයේ දී වර්ණවත් ලාකඩ නිපදවා ගනු ලැබේ. එසේ වුව ද, වර්තමානයේ දී නිර්මාණ සඳහා ආනයනික අමුද්‍රව්‍ය භාවිතා කරනු ලැබේ. මෙවැනි කර්මාන්ත සඳහා නැවතත් අවධානය යොමු කිරීම තුළින් ගිලිහී යන සාම්ප්‍රදායික වටිනාකම් සහිත අත්කම් නිර්මාණ අනාගතය සඳහා දායාද කර ගැනීමේ හැකියාවක් පවතී. එලෙස ම, පටපණුවන් (Silkworm- *Bombyx mori*) වගා කිරීම තුළින් සේද නූල් නිෂ්පාදනය සිදුකරගත හැකි ය. අතීතයේ දී ශ්‍රී ලංකාව තුළ මෙය ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වුව ද, වර්තමානය වන විට එය දක්නට නොමැත.



කෘමීන් ආශ්‍රිත මෙවැනි කර්මාන්ත නැවත ප්‍රතිස්ථාපනය කිරීම තුළින් සංචාරක අවධානය ඒ සඳහා යොමු කර ගැනීමේ හැකියාවක් පවතී.

- ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය කෘෂිකර්මාන්තය තවමත් සුළු පරිමාණ ගොවීන් අතර දෝලනය වන බැවින් ග්‍රාමීය ප්‍රජාව මත පදනම් වූ කෘෂි සංචාරක ආකෘතීන් පහසුවෙන් හඳුන්වා දෙමින් කෘෂි සංචාරක ව්‍යාපාරය හඳුන්වාදීමේ ඉහළ හැකියාවක් පවතී. ප්‍රාදේශීය වශයෙන් ග්‍රාමීය මට්ටමෙන් සංවිධානය වූ කුඩා ගොවි කණ්ඩායම් මේ වන විටත් කෘෂි සංචාරක ව්‍යාපාරයේ වැදගත්කම හඳුනා ගනිමින් සිටියි. උපායමාර්ග විවිධාංගීකරණය මඟින් ගොවීන් හට වාසි සලසා ගැනීමේ හැකියාව පවතින අතර වර්තමානයේ කෘෂිකර්මාන්තයෙන් ක්‍රම ක්‍රමයෙන් ඉවත්වන තරුණ ප්‍රජාව නැවතත් කෘෂි කර්මාන්තයට ආකර්ෂණය කර ගැනීමේ හැකියාව තිබේ. රැකියා විරහිත කාන්තාවන් මෙන් ම, ගෘහණියන්ගේ දායකත්වය ද කෘෂිසංචාරක ව්‍යාපාරය ට ලබා ගැනීමේ ඉහළ හැකියාවක් පවතී.

- දේශීය සහ සාම්ප්‍රදායික දැනුම සහ භාවිතයන් අනාගත පරපුර සඳහා හඳුන්වා දෙමින් ඒවා රැකගැනීම සඳහා ද මෙමඟින් පිටිවහලක් සැලසේ. හඳුනාගත් නිකේත හරහා විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ගැනීම තුළින් විදේශ විනිමය ඉපැයීමේ ප්‍රවණතාවයක් පවතී. උදාහරණයක් ලෙස කිතුල් සහ තල් ආශ්‍රිත කර්මාන්ත වන පැණි සහ හකුරු නිෂ්පාදනය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගත හැකි ව්‍යාපාර වේ.

- දේශීය ආයුර්වේද වෛද්‍ය විද්‍යාව යනු කෘෂිසංචාරක ව්‍යාපාරය ට යොදාගත හැකි ඉහළ විභවයක් සහිත තවත් එක් ක්ෂේත්‍රයකි. එමඟින් කෘෂිසංචාරක ව්‍යාපාරය ට විශේෂ වටිනාකමක් එක් කළ හැකි ය. සාම්ප්‍රදායික ආයුර්වේද ප්‍රතිකාර සහ චිකිත්සාවන්, දේශීය



ඖෂධ වර්ග හඳුනාගැනීම, දේශීය ඖෂධීය කැඳ වර්ග සහ දේශීය ඖෂධ මඟින් සිදු කරන සම්බාහන පිළිබඳ ව සංචාරකයින්ගේ උනන්දුවක් පවතී. එබැවින්, දේශීය ඖෂධ උද්‍යාන සහ ඒ ආශ්‍රිත ව නිර්මාණය වූ නවාතැන් සඳහා ඉහළ විභවයක් ඇත. යෝගා අභ්‍යාස සහ භාවනා යනා දී ක්‍රියාකාරකම් මේ සමඟ මුසු කිරීමේ හැකියාවක් පවතී.

වර්තමානයේ සුළු පරිමාණයෙන් කෘෂි සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. එසේ වුව ද, සැලසුම් සහගතව සහ රාජ්‍ය-පෞද්ගලික පාර්ශ්වවල අනුග්‍රහය සහිත ව දියත්කිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟී තිබේ. කෘෂිසංචාරක ව්‍යාපාරය හොඳින් සැලසුම් කළ ව්‍යාපාරයක් ලෙස නියමිත තත්ත්වපාලන සහ නිසි නියාමනයක් යටතේ පවත්වාගෙන යාම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ට සැලකිය යුතු දායකත්වයක් ලබාගැනීමට හැකියාව ලැබේ.




**මහාචාර්ය මේනකා ප්‍රනාන්දු**

**භෝගවිද්‍යා අධ්‍යයනාංශය**

**කෘෂිකර්ම පීඨය**

**රුහුණ විශ්වවිද්‍යාලය**



# ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ව්‍යාපාරයේ අවස්ථා සංවර්ධනය සහ සැලසුම්



**කෘ**ෂි සංචාරක ව්‍යාපාරය යනු ශ්‍රී ලංකාව ට නවමු අත්දැකීමක් වුව ද, දැනටමත් මෙම කෘෂි සංචාරක ව්‍යාපාරයේ ආර්ථීක උත්පාදන ක්‍රියාවලියක් ලෙස යෙදී ඇති ගොවීන් හා ව්‍යවසායකින් සැලකිය යුතු ප්‍රමාණයකි. කෘෂි සංචාරක ව්‍යාපාරය විද්‍යානුකූල ව අර්ථ දැක් වූ විට එය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ ග්‍රාමීය සංචාරක ව්‍යාපාරය ඒකාබද්ධ කරන කෘෂිකර්මාන්තයේ නවමු ආකාරයක් වේ. එය කෘෂිකර්මාන්තය තුළින් ආදායම් උපදවා ගත හැකි ඉතා විශාල විභවතාවයක් පවතින ආදායම් උත්පදන ක්‍රියාවලියකි. මෙය කෘෂිකාර්මික නිෂ්පාදනය හා සැකසුම් සංචාරක ව්‍යාපාරය සඳහා ඒකාබද්ධ ව සිදුකරන වාණිජ ව්‍යවසායකයක් ලෙස ද හඳුන්වා දිය හැකි ය. මෙහි දී, මූලික වශයෙන් කෘෂිකර්මාන්තයේ යෙදී සිටින ගොවීන් හෝ ව්‍යවසායකයින්ගේ ආදායම එකවර ඉහළ නැංවෙන අතර සංචාරය සඳහා පැමිණෙන අමුත්තන්හට දැනුම, අත්දැකීම, විනෝදාස්වාදය සමඟ නැවුම් කෘෂි ආශ්‍රිත නිෂ්පාදන මිල දී ගැනීමටත්, ඒවා පරිභෝජනය කිරීමටත් අවස්ථාව සැලසේ.

**කෘෂි සංචාරක ව්‍යාපාරයේ වාසි**

කෘෂි සංචාරක ව්‍යාපාරය ග්‍රාමීය සංවර්ධනය හා ශ්‍රී ලංකාවේ ගොවි ගම්මාන තුළ ට හඳුන්වාදීම මඟින් විශේෂ වරප්‍රසාද ලබාගත හැකි වේ.

**1. ආර්ථීක වාසි**

මෙම කෘෂි සංචාරක ව්‍යාපාරය ගොවිපළවල් වෙත හඳුන්වා දීම මඟින් ගොවීන්ගේ ආදායම ඉහළ නංවා මෙම කර්මාන්තයේ නිරතවීම මඟින් කෘෂිකාර්මික ව්‍යවසායකත්වය, නව රැකියා උත්පාදනය, අළුත් මානයක් ඔස්සේ ආදායම් උත්පාදනය, තමාට ම අවේනික සුවිශේෂි වූ කෘෂිකාර්මික නිෂ්පාදනයක ට යොමු වීම සිදු වේ. තව ද, ආගන්තුක සත්කාරය, විවිධ වර්ගයේ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ආහාර නිපදවීම, ඒවා පිළිගැන්වීම සහ සුළු පරිමාණ වශයෙන් ඒවා විකිණීම යන අංශ ආශ්‍රිත ව තම ගොවි පවුලේ ආදායම ඉහළ නංවා ගැනීමේ හැකියාව පවති. එමෙන් ම, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය අනුව ගොවීන් සංවිධානගත වී තම ප්‍රදේශයට ආවේනික කෘෂිකර්මන්තය ට අදාළ නිෂ්පාදනයන් සිදු කරන ආකාරය, කෘෂි නිෂ්පාදන රැකබලා ගන්නා ආකාරය, ජලය පොහොර යොදන ආකාරය, එලදාව නෙළාගන්නා ආකාරය, ඒවා වෙළෙඳපොළ ට ඉදිරිපත් කරන ආකාරය යනා දි අංශ සංචාරකයින් ට පෙන්වීම මඟින් ගොවීන්ගේ ආදායම ඉහළ නංවා ගත හැකි වේ. එසේ ම ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ව පවතින සංස්කෘතික උත්සව, ආහාර පිළියෙල කිරීමේ සම්ප්‍රදායික ක්‍රම විදහා දැක්වීම මඟින් ද කෘෂි සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම ඉහළ මට්ටමකට පත්කොට ගත හැකිය

**2. ග්‍රාමීයව කෘෂි බිම් සහ ග්‍රාමීය ස්වාභාවික භූමි සංරක්ෂණය**

කෘෂි සංචාරක ව්‍යාපාරය නිසා දේශීය හා විදේශීය සංචාරකයින් කෘෂිකාර්මික භූමි සංරක්ෂණය කර, අලංකාර කර සංචාරකයින්ගේ ආකර්ෂණය වැඩි වන ආකාරයට පවත්වා ගත යුතු වේ. එමෙන් ම, ස්වාභාවික භූමි එම ස්වරූපයෙන් පැවතීම හා ස්වාභාවික වාසස්ථාන පවත්වා ගෙන යාම මඟින් සංචාරක ආකර්ෂණය ඉහළයෑම ඔස්සේ විශාල සංචාරක පිරිසක් තම ගම්මානය ට ගෙන්වා ගැනීමේ හැකියාව පවතී. තව ද, මෙම ග්‍රාමීය භූමි ආරක්ෂා කිරීම මඟින් පරිසර හිතකාමි සුන්දර රටක් ද නිර්මාණය වේ.

**3. අධ්‍යාපන අවස්ථා**

ග්‍රාමීය කෘෂි සංචාරක ව්‍යාපාරය මඟින් ආහාර නිෂ්පාදනය, ගොවිතැන් ක්‍රම, ග්‍රාමීය ජීවන රටාවන්, ග්‍රාමීය සංස්කෘතිය පිළිබඳව අමුත්තන් ට ඉගෙන ගැනීමට අවස්ථාව සැලසේ. එසේ ම කෘෂිකර්මාන්තය හා දේශීය පරිසරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම හා අගය වැඩි කිරීම ට ඉඩ සැලසේ. තව ද පාරම්පරික බීජ හා නිෂ්පාදන, භාවිත කරන ලද උපකරණ පිළිබඳවත් සංචාරකයන්, ශිෂ්‍යයන් දැනුවත් කිරීමේ අවස්ථා ද සැකසේ. මෙයට අමතර ව, නව සංකල්ප ඔස්සේ යමින් කෘෂිකර්මාන්තය දියුණු කිරීමේ හැකියාව සහ ඒවා ආශ්‍රිත ව සිදුකළ හැකි නව ආදායම් උත්පාදන ක්‍රියාවලීන් පිළිබඳව සමීක්ෂණය කිරීමේ හැකියාව පවතී. එමෙන් ම, තරුණ පරපුර ගම්මානවලින් ඈත් වී නගරයේ රැකියා සොයාගෙන යාම නවතා ඉතාමත් ඉහළ ආදායම් ලැබිය හැකි පැතිකඩවල් ගැන අවධානය යොමු කිරීමට හා තරුණ තරුණියන්ට මෙවැනි කෘෂි සංචාරක ව්‍යාපාර එහි ආදායම් උත්පාදනය සඳහා යොමුවීමේ අවස්ථා සැලසේ.

**4. ප්‍රජා සහභාගීත්වය**

සංචාරකයින් ට ග්‍රාමීය ගොවි ප්‍රජාව සමඟ සෘජු සම්බන්ධතා පැවත්වීම ට අවස්ථා හිමි වේ. මෙහි දී, ග්‍රාමීය ජනතාව හා සංචාරකයින් අතර ඉතා සමීප



සමාජ සම්බන්ධතාවක් ගොඩනැගෙන අතර ආහාර නිෂ්පාදනය, එහි යෙදවුම් භාවිතය, නිමැවුම් සකස් කිරීම ආදි කරුණු පිළිබඳව හොඳ අවබෝධයක් ලැබේ. මෙමගින් දේශීය මෙන් ම විදේශීය සංචාරකයින් ට ග්‍රාමීය ව තම අදහස් හා සම්පත් ආයෝජනය කිරීමේ හැකියාව ද පවතී.

## 5. ආදායම් විවිධාංගීකරණය

කෘෂි සංචාරක ව්‍යාපාරය, ගොවි ගම්මාන ආශ්‍රිත ව හඳුන්වාදීම මඟින් ගොවීන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට අමතර ව එම නිෂ්පාදන ආශ්‍රිත ව පවතින අගයදාමයන් සංවර්ධනය කිරීම හා ඒවා ආශ්‍රිත ව ඇති අතිරේක ආදායම් උත්පාදන හැකියාවන් කෙරෙහි අවධානය යොමු කරයි. එමඟින් ගොවීන් ස්වභාවික ව සිදුවන වගා හානි ආපදා අවදානම් තත්ත්වය සඳහා මුහුණ දීමේ හැකියාව වර්ධනය වේ. වෙනස් වන වෙළෙඳපොළ තත්ත්වවල ට මුහුණ දීමට ද හැකියාව ලැබේ. සමස්තයක් ලෙස කෘෂි සංචාරක ව්‍යාපාරය ග්‍රාමීය සංවර්ධනය හා ආර්ථික සංවර්ධනය ට යොදා ගත හැකි මෙවලමකි.

## 6. ග්‍රාමීය කෘෂි සංචාරක ව්‍යාපාරය හා සබැඳි සම්පත් හඳුනා ගැනීම

ග්‍රාමීය කෘෂි සංචාරක ව්‍යාපාරය හා සබැඳි සම්පත් හඳුනා ගැනීම යටතේ පහත දැක්වෙන අංශ ඔස්සේ සංචාරක ආකර්ෂණය ඇති කර ගැනීමේ හැකියාව පවතී.

- කෘෂිකාර්මික ශිෂ්ඨාචාර සම්පත් සංවර්ධනය
- පාරිසරික ශිෂ්ඨාචාර සම්පත් සංවර්ධනය
- කෘෂිකාර්මික සංස්කෘතික සම්පත් සංවර්ධනය
- විද්‍යා හා තාක්ෂණ ශිෂ්ඨාචාර සම්පත් සංවර්ධනය

### 6.1 කෘෂිකාර්මික ශිෂ්ඨාචාර සම්පත් සංවර්ධනය

මෙහි දී කෘෂිකාර්මික ශිෂ්ඨාචාරය අමුත්තන්හට ගවේෂණය කිරීම ට අවස්ථාව සලසන අතර සම්ප්‍රදායික සංස්කෘතික උරුමයන් එහි තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි. මෙහි දී, එම උරුමයන් තුළ ගොවීන්ගේ ජීවන රටාව සැකසී ඇති ආකාරය බෞද්ධ සංස්කෘතිය තුළ ගොවි ජනතාව මෙන් ම ගැමියන්ගේ විශේෂ ගුණාත්මක තත්ත්වයන් හා සරල බව පිළිබඳව, සංචාරකයින්ට

අවබෝධයක් ලැබේ. එමෙන් ම පැරණි වටිනාකම් වන "සැමට සම සේ සැලකීම", වැඩ බෙදාගෙන සිදු කිරීම ආදිය ද දැක්විය හැකි ය.

එසේ ම, අතීතයේ දී ගොවීන් කෘෂිකර්මාන්තය ට භාවිතා කළ උපකරණ ගොවිතැන සඳහා උපයෝගී කොට ගත් ආකාරය සහ ඒවායේ සංවර්ධනය හා විකාශනය කෘෂි සංචාරක කර්මාන්තය ට වැඩි වටිනාකමක් එක් කරයි. එමෙන් ම, ග්‍රාමීය ව පවතින සංස්කෘතික උරුමයන් විශේෂයෙන් ම, පුරාණ විහාරස්ථාන, ඒවාට අදාළ චිත්‍ර, බිතුසිතුවම්, ගොඩනැඟිලි නිර්මාණය කර ඇති ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රම සංචාරක ආකර්ෂණයට බෙහෙවින් බලපෑම් ඇති කරයි. එමෙන් ම, පැරණි වාස්තු විද්‍යාත්මක ක්‍රමවේද සහ වටිනාකම් තවදුරටත් කෘෂි සංචාරක ආකර්ෂණය ඉහළ නංවයි. තව ද, පාරම්පරික හස්ත කර්මාන්ත, සම්ප්‍රදායික රටා කලාව, ජනසිරිත් විරිත් සහ ජන කතා වැනි කුසලතා පෙන්වීම මඟින් ද, සංචාරක ආකර්ෂණය තවදුරටත් වර්ධනය කර ගත හැකි ය. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ජනකවි, විවිධ වගාවන් ආශ්‍රිත ව පවතින සංස්කෘතික උරුමයන් විශේෂයෙන් ම, වී වගාව ආශ්‍රිතව පැවති පැල්කවි ආදිය විශේෂ කුසලතා ලෙස හොවා දක්වමින් පාසල් දරුවන්ට හා සංචාරකයින්ට ඒවායේ නිරත වීමට අවස්ථාව සලසමින් ක්‍රියාකාරී කෘෂි සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා ඉහළ විභවතාවයක් පවතී.

## 6.2 පාරිසරික ශිෂ්ඨාචාර සම්පත් සංවර්ධනය

පරිසර හිතකාමී ලෙස පරිසර පද්ධතියේ කොටසක් ලෙස ජීවත් වීම ඉතාම උචිත බව වර්තමානයේ බොහෝ විද්වතුන්ගේ මතයයි. ඒ අනුව, ආහාර ලබා ගැනීම, පරිසරය ට නිරාවරණයවීම හා ඒතුළින් මනසේ නිරවුල් බව ඇති කිරීම ආදි







ක්‍රියාකාරකම්වල ට මුල් තැන දීම මඟින් කෘෂි සංචාරක අංශය තවදුරටත් ශක්තිමත් කිරීමේ හැකියාව පවතී. මෙහි දී, විශේෂයෙන් ම පිරිසිදු නිෂ්පාදන, බලශක්ති ප්‍රභවයන් උපරිම ව භාවිතා කිරීම, ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, නැවත නැවත භාවිතා කිරීම පිළිබඳ සංචාරකයින් දැනුවත් කිරීම මෙන් ම ඒ සඳහා වැඩි උනන්දුවක් දක්වන සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමත්, පැළ සිටුවීම, පැළ රැකබලා ගැනීම ආදි ක්‍රියාකාරකම් ද හඳුන්වා දිය හැකි ය. මේ යටතේ උදාහරණ ලෙස චීනයේ පරිසරය ආශ්‍රිත ව කෘෂි සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ දී, සංචාරකයින්ගේ මූල්‍යමය හැකියාව මත වගාවන් ඔවුන්ගේ නමින් මිල දී ගෙන පවත්වාගෙන යාම යන සංකල්පය යටතේ දෙහි වගා කර, එම දෙහි ගසක් හෝ ගස් කිහිපයක් අවුරුද්දකට යම් කාලයකට මිල දී ගෙන එම ආදායම් සංචාරකයින්ට ලැබෙන ආකාරයෙන් ඔවුන් සංචාරක කර්මාන්තයේ කොටස්කරුවන් බවට පත් කරගනිමින් සංචාරකයින් ආකර්ෂණ කර ගැනීමට අවස්ථාව සලසයි.


### 6.3 කෘෂිකාර්මික සංස්කෘතික සම්පත් සංවර්ධනය

මේ යටතේ දී කෘෂිකර්මය ට අදාළ සංස්කෘතිමය ක්‍රියාකාරකම් තුළින් කෘෂි සංචාරක ව්‍යාපාරය සිදු කෙරේ. එහි දී වී ගොවිතැන සහ අනෙකුත් වගාවන් ආශ්‍රිත ව පවතින ජාතික වප් මඟුල් මංගල්‍යය, අළුත් සහල් මංගල්‍යය, ගම්භාර දෙවියන් පිදීම, ගම්මඩු, දෙවොල් මඩු, කෙම්මුර ආදි සංස්කෘතික උරුමයන් විදහා දැක්වෙන ලෙස සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සිදු වේ. එමෙන් ම, සංචාරකයින්ට අවශ්‍ය නවීන පහසුකම් සමඟම පුරාණ අගයන් සුරැකෙන අයුරින් සකස් කරනු ලැබූ නවාතැන් පහසුකම් ආදිය සැපයීම ද සිදු කළ හැකි ය

### 6.4 විද්‍යා හා තාක්ෂණ ශිෂ්ඨාචාර සම්පත් සංවර්ධනය

මෙහි දී, නවීන තාක්ෂණය උපයෝගි කොට ගනිමින් කෘෂිකර්මාන්තය මෙහෙයවීම සහ නවීන තොරතුරු තාක්ෂණය උපයෝගී කරගෙන කෘෂිකර්මය සවිබල ගැන්වීම සංචාරකයින්ට නැවුම්







අත්දැකීමක් වනු නො අනුමානය. නවීන උපකරණ කෘෂිකර්මාන්තය ට යොදාගෙන ඇති ආකාරය, ඒවායේ කාර්යක්ෂමතාවය හා පහසුව පිළිබඳව සංචාරකයින් දැනුවත් කෙරේ. මේවා දැනට පවතින කෘෂිකර්මාන්තයට අදාළ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතනවල මැදිහත් වීමෙන් සිදු කිරීමේ හැකියාව පවතී.

**මල් ආශ්‍රිත කෘෂි සංචාරක ව්‍යාපාරය**



මල් ආශ්‍රිත කෘෂි සංචාරක ව්‍යාපාරය ලෝකයේ විවිධ රටවල සිදු කෙරෙමින් පවතින ඉතාමත් ආකර්ෂණීය සංචාරක ව්‍යාපෘතියකි. මෙහි දී, විවිධ දේශගුණික කලාපවල ට ආවේණික මල් විශාල ප්‍රමාණයක් (Sea of flower) වගා කිරීම මඟින් සංචාරකයින් ආකර්ෂණය කර ගනු ලබයි. මේ මඟින් පුද්ගලයින්ගේ මානසික සෞඛ්‍ය සංවර්ධනය හා ඔවුන් ට ඉතා වැදගත් වන ඉතා අලංකාර මතකයන් ඡායාරූප ගත කිරීම මඟින් සංචාරකයින් මෙයට ආකර්ෂණය කරගත හැකි ය. මෙම මල් ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය සඳහා වයස් භේදයකින් තොරව පුද්ගල ආකර්ෂණය සිදු කර ගැනීමේ හැකියාව පවතී. මෙහි දී, විවිධ රටවල උද්‍යාන ආශ්‍රිත ව විශාල වශයෙන් මල් වගා කර ඒවා නැරඹීමට පුද්ගලයන් ආකර්ෂණය කිරීම සිදු වේ. මල් ආශ්‍රිත උත්සව සංවිධානය කිරීම බටහිර ලෝකයේ බහුල ව සිදුවන කාර්යයකි. මෙමඟින්

ප්‍රදේශයේ සංචාරකයින් ඉහළයෑම මඟින් ප්‍රාදේශීය වශයෙන් ආදායම් ඉහළ යාම සිදුවේ. මෙම සිද්ධාන්තය පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල ට අවේණික මල් වර්ග හඳුනාගෙන ඒවා විශාල වශයෙන් උද්‍යාන ආශ්‍රිත ව හා මාර්ග දෙපස වගා කිරීම මඟින් සංචාරකයින් ආකර්ෂණය කරගත හැකි ය. එමෙන් ම, නුවරඑළිය ප්‍රදේශය ආශ්‍රිත ව මල් උත්සව සංවිධාන කිරීම මඟින් කෘෂි සංචාරක ව්‍යාපාරය වර්ධනය කොට ගත හැකි ය. එමෙන් ම, මල් ආශ්‍රිත ව විවිධ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල ට ද සම්බන්ධ වීමේ අවස්ථා උදා වේ. අනුරාධපුරය, පොළොන්නරුව වැනි වියළි කලාපයන්ට ගැලපෙන බෝගන්විලා වැනි මල් මාර්ග දෙපස වගාකිරීම මඟින් සංචාරක ආකර්ෂණය ඉහළ මට්ටමකට පත් කොට ගත හැකි ය.

එමඟින් ශ්‍රී ලංකාව ලස්සන රටක් බවට භෞතික ව පරිවර්තනය කිරීමේ හැකියාව පවතී. Flower theme park යන සංකල්පය අනුව මල් විශාල වශයෙන් වගා කිරීම ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ අදාළ ප්‍රදේශයේ කාලගුණ හා දේශගුණික වෙනස් වීම අනුව ය. එබැවින්, මල් ආශ්‍රිත ව කෘෂි සංචාරක ව්‍යාපාරයේ නිරත වන්නෙකු හට මල් නැති කාලවල දී ( off season) තම සංචාරක කර්මාන්ත පවත්වා ගත හැකි පරිදි විසිතුරු පැළ හා එම කාලවල දී වගා කළ හැකි මල් වර්ග හඳුනාගෙන තිරසර ලෙස තම ව්‍යාපාරය පවත්වාගෙන යාම වැදගත් වේ. එමෙන් ම, වගුරු ආශ්‍රිත ව පාත්ති ක්‍රමයට හෝ පාවෙන මල් පාත්ති ලෙස හෝ මල් වගා කිරීම හා ඒවා නැරඹීමට අවස්ථා සලසාදීම මඟින් කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කළ හැකි ය . ඊට අමතර ව, උදාහරණයක් ලෙස චීනයේ හෙල්මළු ආශ්‍රිතව විශාල වශයෙන් මල් වගා කර, සංචාරක ආකර්ෂණය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යනු ලබයි.

ජන සංචාරක ව්‍යාපාරය (Folk tourism) මෙහි දී ප්‍රධාන වශයෙන් විවිධ ප්‍රදේශ ආශ්‍රිත ව සංස්කෘතික අනන්‍යතාවය පෙන්වා දෙනු ලබන සංචාරක ව්‍යාපාර අවස්ථාවක් ලෙස හඳුන්වා දිය හැකි ය. මේ යටතේ දී, විවිධ සම්පත් භාවිතා කළ හැක. මෙහි දී, ස්පර්ශ කළ හැකි හා ස්පර්ශ කළ නොහැකි ලෙස (tangible and intangible ) මෙම සම්පත් හඳුනාගත හැකි ය. මේ යටතේ දී ජාතික වශයෙන් වැදගත් වන ස්පර්ශ කළ හැකි සම්පත් ලෙස ජාතික ඇඳුම උදාහරණ වශයෙන් ගත හැකිය. ජාතික ඇඳුම, සමාජ විකාශනය අනුව අතීතයේ සිට මේ දක්වා විකාශනය වී ඇති ආකාරය පෙන්වා දිය හැකි ය. එසේ ම, ජාතික වශයෙන් වැදගත් වන විවිධ කලා සහ සංස්කෘතික උත්සව, විශේෂයෙන් ම, දැනටමත් විශාල ප්‍රසිද්ධියක් උසුලන පෙරහැර, සම්ප්‍රදායික සංගීතය සහ නර්තනයන්, සම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව, සම්ප්‍රදායික ජන ක්‍රීඩා යනාදිය ස්පර්ශ කළ නො හැකි ගණයට (intangible) ඇතුළත් වේ. විවිධ ක්‍රියාකාරකම් හඳුන්වා දෙමින් කෘෂි සංචාරක ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ විශේෂ විභවතාවයක් ද පවතී.

දැනට විශාල වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් මෙරටට උරුම වූ ආගමික සිද්ධස්ථාන හා ස්වභාව සෞන්දර්ය සහිත ස්ථාන නැරඹීම තවදුරටත් පුළුල් කරමින් විවිධ ක්‍රියාකාරකම් හඳුන්වා දෙමින්, කෘෂි සංචාරක කර්මාන්තය හඳුන්වා දීම ඉතා වැදගත් වේ. එමඟින් දේශීය හා විදේශීය සංචාරකයින් සක්‍රිය ව සම්බන්ධවීම තුළ කෘෂි සංචාරක ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමේ විශාල විභවතාවයක් මෙන් ම ගොවි ජනතාවගේ ආදායම් උත්පාදන ක්‍රියාවලියක් ලෙසත්, ග්‍රාමීය ව සාමූහික ව සිදු කරන ක්‍රියාකාරකමක් ලෙස ත් ප්‍රචලිත කිරීමේ හැකියාව පවතී.




**සාගරිකා හිටිහාමු**

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී**


**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**



# කෘෂි සංචාරක ව්‍යාපාරය හා සබැඳි බෙලිහුල්ඔය නිම්නයේ සොඳුරු ගොවිපළ නවාතැන







දියුණු සහ ප්‍රෞඪ කෘෂිකාර්මික ඉතිහාසයකට ශ්‍රී ලංකාව උරුමකම් කියයි. එවන් බිමක වසන පිරිසකගේ සිරුරට කාවැදුනු දෙයක් සේ කෘෂිකර්මය හැඳින්විය හැකිය. එය සංස්කෘතියේ අංගයකි. කෙසේ හෝ වර්තමාන ජීවන රටාව හා සමාජ ක්‍රමය නිසා කෙමෙන් කෙමෙන් කෘෂිකර්මය හා ඇති සබැඳියාව ගිලිහෙමින් පවතී යි. එවන් සමයක සබරගමුව විශ්වවිද්‍යාලය අසලින් දිව යන සමනල වැව මානයේ ඇති මෙම මනරම් කෘෂි නැවතුම්පළ ගිලිහී ගිය පැරණි ඉතිහාසයට එබිකම් කරන්නට ඇති හොඳම ස්ථානයක් සේ හැඳින්විය හැකි ය.

සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි පීඨය යටතේ නඩත්තුවන සබරගමුව කෘෂි ගොවිපළ කෘෂි සංචාරක ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. එනම්, කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හා සංචාරක ක්‍රියාකාරකම් එකට එක්කරමින් සංචාරකයින්ට ගොවිතැනේ ජීවන රටාව, කෘෂිකර්මය ආශ්‍රිත ආහාර සංරක්ෂණය, වාණිජ කෘෂි ක්‍රමවේද ඇතුළු විවිධ ක්ෂේත්‍ර පිළිබඳ අත්දැකීම් ලබාදෙන ස්ථානයක් ලෙස ද හැඳින්විය හැකි ය. මෙය ගොවියෙකුට අතිරේක ආදායම් මාර්ගයක් වශයෙන් ද සංචාරකයින් ට අද්විතීය අත්දැකීමක් ලෙස ද සැලකිය හැකි ය. නව කෘෂිකර්මාන්තය, කෘෂි සංචාරක නව කර්මාන්තයක් වන අතර මෑත කාලීන ව එය ජනප්‍රිය වෙමින් පවතී. දේශීය හා කාබනික ආහාරවල ජනප්‍රියතාව ඉහළයාම මෙන් ම, බොහෝ දෙනා ගොවිපළෙන් මේසයට ජීවන රටාව අත්විඳීමේ ප්‍රවණතාව වැඩිවීම මෙයට හේතුව වේ. එමෙන් ම, මෙම කර්මාන්තය මඟින් මිනිසුන්ට ඔවුන්ගේ ආහාර ප්‍රභවය සමඟ සම්බන්ධවීම ට ඉඩ සලසයි. තව ද ආහාර නිෂ්පාදනය කිරීමට ගන්නා වෙහෙස මහන්සිය පිළිබඳව ද අවබෝධයක් ලැබෙයි. කෘෂි සංචාරක ව්‍යාපාරයෙන් ගොවියා ට මෙන් ම පාරිභෝගිකයාට ද බොහෝ ප්‍රතිලාභ අත් වේ. මෙමඟින් එදිනෙදා ජීවිතය ගැටගසා ගැනීම ට වෙහෙසෙන කුඩා පරිමාණයේ ගොවීන්ගේ ආදායමට අත්‍යවශ්‍ය තල්ලුවක් ලබාදිය හැකි ය. මෙයට අමතර ව ගොවීන් ට ඔවුන්ගේ ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීමට මෙය ඉතා හොඳ මාර්ගයක් වේ. එසේ ම, කෘෂි සංචාරක ව්‍යාපාරය මඟින් පාරිභෝගිකයන් හට ගොවිපළ ජීවිතය ගැන ඉගෙන ගත හැකි අතර අද්විතීය නිවාඩු අත්දැකීමක් ද ලබා ගැනීමට හැකියාව ලැබේ.

**ගොවිපළ නවාතැන්**

ඉතා සාරවත් වූ අරුම පුදුම භූමි ප්‍රදේශයක ට අයිතිවාසිකම් කියන සබරගමුවේ කෘෂි විද්‍යා පීඨ ගොවිපළ සංචාරකයින් සඳහා විවෘත කර ඇති අංග සම්පූර්ණ කබානා තුනකින් සමන්විත වෙයි. මෙම කබානා තුළ නිදනකාමර ඒකක හා නාන කාමර ඒකක පිහිටා තිබේ. මෙහි නවාතැන් ගන්නන් හට විශේෂ සේවාවන් සැපයෙන අතර ඒ සඳහා ඉතා සාධාරණ මුදලක් අය කරනු ලබයි. විවිධ වර්ගයේ වූ ආහාරපාන රසකින් යුක්තව අමුත්තන් හට ආහාර මේසය සැකසෙන අතර එය දේශීය හා විදේශීය ආහාර සංචාරකයන්ගේ සිතැඟි පරිදි ලබාගත හැකි ය.

**විල් වාස**

ගොවිපළක සිට පෙනෙන වැවක යම් ආශ්චර්යයක් හා අසිරිමත් බවක් පවතියි. එය සැබෑ ජීවිතය හා සබැඳි චිත්‍රපටයක දර්ශනක් වැනි ය. ගොවිපළ යනු නගරයේ කාර්යබහුල ජීවන රටාවෙන් මිදී විවේක ගැනීමට සුදුසු ස්ථානයකි. කනට මිහිරි හා මනස නිවන ස්වභාව දහමේ හඬ, නැවුම් වාතයේ සුවඳ, උදෑසන හිරු කිරණ වැනි ජීවිතයේ සරල දේවල් ආකර්ෂණීය ලෙස ඔබට භුක්ති විඳීමේ හැකියාව ලැබේ. සමනල වැවෙ හි විස්තීර්ණ දර්ශනය ඔබේ සිත් ඇදගන්නා බව නිසැකය, ඉඩකඩ සහිත ගෘහස්ථ සහ එළිමහන් ප්‍රදේශ සෑම කෙනෙකුට ම නිදහසේ පරිසරය විඳගැනීමට අවස්ථාව ලබාදෙයි. ඔබ නිදහස් නිස්කලංක ස්ථානයක් සොයන්නේ නම් විල් වාස හොඳම විකල්පයකි. එය ඔබට විවේක ගැනීමට විනෝද වීමට හා ස්වභාදහමේ සුන්දරත්වය භුක්ති විඳීමට හැකි සොඳුරු නවාතැනකි.

**කෙත් වාස**

සුන්දර ගොවිපළ දර්ශනයක් යනු ඔබව පිනවීමට සමත් තවත් එක් සොඳුරු ස්ථානයකි. එවන් මනරම් දසුනක් නිදහසේ අත්විඳිය හැකි සොඳුරු නවාතැන කෙත් වාස වේ. උදෑසන හිරුත් සමඟ විහිදෙන කෙත් යාය ඔබට මානසික සුවය ලබාදෙනු නිසැක ය. මෙම නවාතැනේ සිට, බොහෝ බෝග වගාවන්, තණබිම් සහ ගොවිපල සතුන් සහිත දර්ශනීය ගොවිපළක් දැකගත හැකිය.

**<u>ගිරි වාස</u>**

නවාතැන දෙසට පෙනෙන මනරම් කඳුවැටිය ඉතා විශාල හා පුළුල් ය. මෙම උදෑසන දර්ශනය ඔබේ නෙත සිත ඇද ගැනීමට සමත්වනු නො අනුමාන ය. සවස් යාමයේ හිරු බැස යන දර්ශනය ද වර්ණවත්

හා ඉතා විචිත්‍රවත්ය. ඔබ පාරාදීසයක ජීවත් වන බවක් ඔබට හැඟෙනු ඇත. එමෙන් ම, මෙය ඉතා සාමකාමී හා නිස්කලංක වන අතර කඳු අතරින් හමන නැවුම් වාතය ඔබේ ගත සිත කුල්මත් කරවනු නො අනුමාන ය.



තව ද, සංචාරකයින් හට විශේෂ අත්දැකීම් සමුදායක් ලබාදීම සබරගමුව කෘෂි ගොවිපළ මඟින් සිදු වේ. මෙමඟින් කෘෂි වගා පිළිබඳව විවරණාත්මක අත් පත්‍රිකා යටතේ පළිබෝධ පාලනය, පොහොර භාවිතය, ජල කළමනාකරණය ආදිය පිළිබඳ දැනුම ලබාගත හැකි ය. කාබනික ගොවිතැන පාරම්පරික ගොවිතැන හා ගොවිපළ සතුන් හැසිරවීම පිළිබඳව ද බොහෝ කරුණු දැන ගැනීමට හැකියාව ලැබේ.



## සංචාරකයින් ට අත්දැකීම් ලබාගත හැකි ක්‍රියාකාරකම්

- ගොවිපළ සතුන්ට ආහාර දීම.
- ගොවිපළ සතුන් හැසිරවීම.
- මත්ස්‍ය පාද සම්බාහනය.
- කුරුල්ලන් නැරඹීම.
- කිරි දෙවීම.
- කඳු නැඟීම.
- ඔසු උයන නැරඹීම.
- බෝග අස්වනු නෙළීම.
- විනෝද ක්‍රීඩා.
- කඳවුරු ක්‍රියාකාරකම්



කෘෂි විද්‍යා පීඨ ගොවිපළ තුළ ඇතිකරන කුකුළන්, එළුවන්, හරකුන්, ඌරන්, හාවන්, තාරාවන් හා පාත්තයින් වැනි සතුන් නිරීක්ෂණය ට හා හැසිරවීම ට මෙහි දී අවස්ථාව සලසා දෙයි. මෙහි දී කුකුල් පැටවුන්, වසු පැටවුන් නිරීක්ෂණය, ඔවුන්ට ආහාර ලබා දීම ආදී සංචාරකයින් කැමති අත්දැකීම් බොහොමයක් ලබාගත හැකි ය. එමෙන් ම, මෙම සතුන් සඳහා අවශ්‍ය ආහාර වර්ග නිෂ්පාදනය සිදුකරන ඒකකයක් ද ගොවිපළ තුළ පවතී. නැවුම් එළකිරි, බිත්තර ඇතුළු සත්ත්ව නිෂ්පාදන මිල දී ගැනීමට අවස්ථාව සලසා දීම ද මෙම සත්ත්ව පාලන ඒකකය මඟින් සිදුකරයි. ගොවිපළ තුළ පිහිටි ඔසු උයන, විසිතුරු මත්ස්‍ය ඒකකය හා මී මැසි පාලන ඒකකය සංචාරක ආකර්ෂණය ලබාගත් අනෙකුත් විශේෂ අංග ලෙස දැක්විය හැකි ය. ඔසු උයන යනු සෞඛ්‍යයට ප්‍රයෝජනවත් ස්වභාවික බෙහෙත් බෝගවල විශාල විවිධත්වයක් රැඳී ඇති ස්ථානයකි. සංචාරකයින් ට මෙම බෝග නිරීක්ෂණය කිරීමට මෙන් ම, අවශ්‍ය නම් මෙම බෙහෙත් බෝගවල කොටස් මිල දී ගැනීමට ද හැකියාව පවතී. එසේ ම,









විවිධ වර්ගවල අලංකාර මත්ස්‍යයින් සංරක්ෂණය කර ඇති විසිතුරු මත්ස්‍ය ඒකකය නිරීක්ෂණය කිරීම හා ඒවා වාණිජ මට්ටමෙන් ඉදිකරන ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීමට ද විසිතුරු මසුන් මිල දී ගැනීමට ද, හැකියාව පවතී. එසේ ම, මී මැසි පාලන ඒකකය තුළ සිදුවන ක්‍රියාවලිය නිරීක්ෂණය හා මී පැණි එකතු කරන ක්‍රම පිළිබඳ දැනගැනීම ද පිරිසිදු මී පැණි මිල දී ගැනීමට ද ඉඩකඩ ලැබේ. එවැනි ක්ෂේත්‍ර ගණනාවකින් සැදුම්ලත් සබරගමුව කෘෂි ගොවිපළ මඟින් සමාජ - ආර්ථික හා අධ්‍යාපනික යන අංශ කිහිපයක ම දියුණුවට අවශ්‍ය මඟ සාදයි.

මේ අනුව, කෘෂි ගොවිපළක් කෘෂි සංචාරක ස්ථානයක් ලෙස පිහිටුවීමෙන් විවිධාකාරයේ ප්‍රයෝජන ලබා ගත හැකි ය. මෙවැනි ස්ථානයක් අධ්‍යාපනික වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් ම සිසුන්ට හා සංචාරකයින්ට බෝග වගා ක්‍රම, සත්ත්ව පාලනය හා සත්ත්ව පෝෂණය, ආහාර සැකසීම, පරිසර කළමනාකරණය වැනි කරුණු සජීවී ව හැදෑරීමට ද අවස්ථාව හා හැකියාව ලබා දේ.

කෘෂි ගොවිපළක් සංචාරක ස්ථානයක් වශයෙන් දියුණු කිරීම පරිසරහිතකාමී ක්‍රමවේද මත පදනම් වන අතර ජෛව විවිධත්වය ස්වභාවික සම්පත් ආරක්ෂාව සහ තිරසාර සංවර්ධනයට ද එය දායක වේ. එමඟින්, දේශීය සංස්කෘතිය රැකගැනීම ගම්මාන සංවර්ධනය සහ සමාජ සබඳතා වර්ධනය වීම ද සිදු වේ. මේ නිසා, කෘෂි ගොවිපළක් කෘෂි සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගැනීම ශ්‍රී

ලංකාවේ අනාගත සංචාරක කර්මාන්තය සඳහා ඉතා වටිනා යෝජනාවකි. කෙසේ වෙතත්, අනෙකුත් ව්‍යාපාරවල මෙන් ම කෘෂි සංචාරක ව්‍යාපාර වල ද මුහුණ පෑමට සිදුවන අභියෝග පවතී. බොහෝ කෘෂි ගොවිපළවල සංචාරකයින්ට අවශ්‍ය විලාසිතාවන් ට හා අභිලාෂයන් ට ගැලපෙන ලෙස පහසුකම් නො පවතී. මේ සඳහා නාන කාමර නවාතැන් ආරක්ෂාව සහ මාර්ග පහසුකම් වැනි දෑ නිරන්තරයෙන් සංවර්ධනය විය යුතු ය. ගොවියන් හා හෝ කෘෂි ආයතනවල කාර්ය මණ්ඩලය සංචාරකයින් සමඟ සන්නිවේදන සේවා සැපයීම සහ පාරිසරික කළමනාකරණය සඳහා වෘත්තීය පුහුණු නො ලැබීම, සේවා මට්ටම පහත දමයි. කෘෂි සංචාරක ව්‍යාපෘති සඳහා මූල්‍ය ආයෝජන නොමැතිවීම, ඉදිකිරීම් හා නවීකරණ කටයුතුවල ට බාධාවක් වෙයි. බොහෝ කෘෂි සංචාරක ස්ථාන, විශේෂයෙන් කලාපීය මට්ටමින් වුව ද ජනප්‍රිය නොවීමට හේතුව වෙළෙඳ ප්‍රචාරණයේ සහ තොරතුරු සන්නිවේදනයේ දුර්වලතාවයයි. කෘෂි සංචාරක ව්‍යාපෘති සඳහා ජනතාවගේ සහභාගීත්වය අත්‍යාවශ්‍ය වේ. කෙසේ වෙතත්, ප්‍රාදේශීය සමාජය මෙයට සහාය නො දැක්වීමෙන් ව්‍යාපෘති අසාර්ථක විය හැකි ය. සංචාරකයින්ගේ වාහන භාවිතය හා අපද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීම වැනි කරුණු මත පරිසරයට හානිවීමේ හැකියාව පවතී. මෙය පරිසරයේ නිස්කලංක හා සංසුන්භාවයට බාධා පමුණුවයි.

කෘෂි සංචාරක ව්‍යාපාරය යනු කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සංචාරක කර්මාන්තය හා බැඳුනු නවතම ක්ෂේත්‍රයකි. සබරගමුව කෘෂි ගොවිපළ වැනි ස්ථාන මෙයට උදාහරණ වශයෙන් දැක්විය හැකි ය. මෙමඟින් ශ්‍රී ලංකාවේ අනාගත කෘෂිකාර්මික සංවර්ධනය සඳහා කෘෂි සංචාරක ව්‍යාපාරය විශාල දායකත්වයක් ලබාදෙන බව පැහැදිලි ය.




**මහාචාර්ය එස්.එච් පී. මල්කාන්ති**

**කෘෂි විද්‍යා පීඨය**

**ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය**





කේ.ඩී. මදූෂා ලක්සරණී පියසේන

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

**වයඹ විශ්ව විද්‍යාලය**



**ගොවි ජනතා සඟරාව තුළ ප්‍රකාශයට පත්වන ලිපි මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ හෝ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අදහස් පිළිබිඹු නොවන අතර ලිපිවල අන්තර්ගතය සම්බන්ධ සම්පූර්ණ වගකීම ලේඛකයින් සතුය.**

# කුළුබඩු වගාව සමඟ බැඳුනු කෘෂි සංචාරක ව්‍යාපාරය



ඉතාමත් ආකර්ෂණීය ජෛව විවිධත්වයකින් යුක්ත වූ ස්වභාවික පරිසර පද්ධති වල ට උරුමකම් කියන ශ්‍රී ලංකාව, මානව සම්පතින් ද පරිපූර්ණ රටකි. මෙම හේතු සාධක නිසා ම ශ්‍රී ලංකාව කෙරෙහි දේශීය මෙන් ම විදේශීය සංචාරකයින්ගේ අවධානය දිනා ගැනීමට හැකියාව ලැබී තිබේ.

- **ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය**

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ දත්තවල ට අනුව, 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව ට පැමිණි විදේශීය සංචාරකයින් සංඛ්‍යාව 248,592 දක්වා 18.18% කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකාව ට පැමිණෙන සංචාරකයින් අතරින් ඉන්දියාව (21.3%) ප්‍රමුඛතම සංචාරක වෙළෙඳපොළ ලෙස පැවති අතර පසුව රුසියාව (14.2%), එක්සත් රාජධානිය (7.5%), ජර්මනිය (5.9%), ඕස්ට්‍රේලියාව (5.3%), චීනය (4.0%), එක්සත් ජනපදය (3.3%), මාලදිවයින (2.8), ප්‍රංශය (2.5%) සහ පෝලන්තය (2.5%) යන රටවල් ප්‍රධාන විය. විදේශීය සංචාරකයින් සංඛ්‍යාව වසරින් වසර 38.07% කින් 2053,465 දක්වා ඉහළ ගොස් ඇත.

Forbes සඟරාවේ ප්‍රකාශිත ආකාරය ට 2024 පළමු මාස 06 තුළ සංචාරකයන්ගේ පැමිණීම 2023 මෙම කාලපරිච්ඡේදයේ පැමිණීම ට සාපේක්ෂව 60% කින් ඉහළ ගොස් තිබේ. මෙම සඟරාවේ 2024 ශ්‍රේණිගත කිරීම්වල ට අනුව, ශ්‍රී ලංකාව එකල සිච්චන වඩාත් ජනප්‍රිය (sdo travel destination) ලෝකයේ සංචාරක ගමනාන්තය ලෙස ශ්‍රේණිගත කර තිබේ. 2025 වසරේ ජනවාරි මාසය තුළ සංචාරකයන්ගේ පැමිණීමේ අගය 252,761 ලෙස වාර්තාගත ඉහළ යාමක් පෙන්නුම් කරයි.


BBC පුවත් සේවය පළමු වර ට ප්‍රකාශයට පත් කළ සංචාරක මඟ පෙන්වීමේ වාර්තාව ට අනුව 2025 වර්ෂයේ සංචාරය කිරීම ට හොඳම ස්ථාන 25 අතර ශ්‍රී ලංකාව ද ඇතුළත් වී තිබේ. ශ්‍රී ලංකාව මෙම ලැයිස්තුවේ 9 වැනි ස්ථානයේ පසුවන අතර එහි පළමු 10 දෙනා අතර සිටින එකම දකුණු ආසියාතික රට ශ්‍රී ලංකාව වීම ද විශේෂත්වයකි. සංචාරක මාධ්‍යවේදීන් සිදුකළ සමීක්ෂණ ප්‍රතිඵල සහ එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය, ලෝක සංචාරක කවුන්සිලය ඇතුළු ලොව පිළිගත් සංචාරක අධිකාරීන්ගේ තොරතුරු සහ සමීක්ෂණ මත පදනම් වෙමින් BBC ආයතනය මෙම වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව, සංචාරක ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී සංස්කෘතික සංචාරක ව්‍යාපාරය, ආගමික සංචාරක ව්‍යාපාරය, සමුද්‍ර සංචාරක ව්‍යාපාරය හා කෘෂි සංචාරක ව්‍යාපාරය ආදී ලෙසින් විවිධ වූ ක්ෂේත්‍ර හඳුනාගත හැකිය. 2023 මහ බැංකු වාර්තාව ට අනුව, කෘෂිකාර්මික අංශය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන අංශය ලෙස පවතින අතර එය දළ දේශීය නිෂ්පාදනය ට 8.28% ක දායකත්වයක් ලබාදෙයි.

- **ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක ව්‍යාපාරය**

මෙහි දී කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රධාන වන අතර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය වර්ධනය වන අංශයක් බවට පත්ව ඇති බැවින් රටෙ හි කෘෂිකාර්මික පිළිවෙත්, සම්ප්‍රදායන් හා ග්‍රාමීය ජීවන රටාව අත්විඳීමට සාංචාරකයින් ට සුවිශේෂී අවස්ථාවක් සැලසෙයි. නිවර්තන දේශගුණය, විවිධ වූ බෝගයන් හා පොහොසත් සංස්කෘතික උරුමයන් සඳහා ප්‍රසිද්ධ ශ්‍රී ලංකාව, දේශීය හා ජාත්‍යන්තර සංචාරකයින් සඳහා ආකර්ෂණීය වන්නා වූ විවිධ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් ඉදිරිපත් කරනු ලබයි. කෘෂි සංචාරක ව්‍යාපාරයට ශ්‍රී ලංකාව තුළ විශාල විභවතාවයක් පවතින බැවින් කෘෂි සංචාරක ව්‍යාපාරය ගොවි ජනතාවගේ තිරසාර ජීවනෝපාය ඉහළ නැංවීමේ ව්‍යාපාරයක් ලෙස යොදා ගැනීමේ හැකියාව සොයා බැලීම සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 2024 වර්ෂයේ දී ආරම්භ කරන ලදි.

මෙම අධ්‍යයනය උතුරු මැද, මධ්‍යම සහ දකුණු පළාත් කෙරෙහි අවධානය යොමු කරමින් ආරම්භ කොට ඇත. මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ කෘෂි සංචාරක ව්‍යාපාරය තිරසාර ජීවනෝපාය ඉහළ නැංවීමේ ක්‍රියාවලියක් ලෙස යොදා ගැනීම ට ඇති ශක්‍යතාව සොයා බැලීමයි. එම ප්‍රධාන





අරමුණට අමතර ව උප අරමුණු කිහිපයක් කෙරෙහි ද අවධානය යොමු කරන ලදී. එනම්,

1. ගොවි ප්‍රජාව අතර කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා බලපාන අභියෝග හා අවස්ථා හඳුනා ගැනීම
2. ගොවි ප්‍රජාව තුළ කෘෂි සංචාරක ව්‍යාපාරයේ වර්තමාන තත්ත්වය සහ ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා සිදුකළ හැකි කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හඳුනා ගැනීම
3. දේශීය කෘෂිකර්මික සංවර්ධනයට දායක වන, පාර්ශ්වකරුවන්ට පවතින බලපෑම හඳුනා ගැනීම.
4. දේශීය හා ගෝලීය වශයෙන් ප්‍රශස්ත කෘෂිකර්මික සංචාරක ව්‍යාපාරයේ භාවිතයන් හා එමඟින් ග්‍රාමීය ඵලදායී කෘෂි සංචාරක ජාල ආකෘතියක් සංවර්ධනය කිරීමේ හැකියාව විමර්ශනය කිරීම

මෙහි දී පර්යේෂණ නියැඳිය ලෙස, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සංචාරක ගමනාන්ත සහ විවිධාංගීකරණය වූ කෘෂිකාර්මික කේන්ද්‍රස්ථාන තෝරාගන්නා ලදි. මෙහි දී සංචාරක ව්‍යාපරය සමඟ එළවළු වගාව, වී වගාව, කුරුඳු වගාව සහ කුළු බඩු වගාව වශයෙන් සංචාරක ව්‍යාපාරය සමඟ කෘෂි ක්ෂේත්‍ර 05ක් ඔස්සේ මෙම පර්යේෂණ ව්‍යාපෘතිය දියත් කරන ලදි. මෙහි දී දත්ත රැස්කිරීම, සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයන, කණ්ඩයම් සාකච්ඡා සහ ප්‍රශ්නාවලි හරහා මෙම කෘෂි සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගෙන් දත්ත රැස් කිරීම සිදුකළ අතර එය මාතලේ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් සිදුවිය.

- **කුළුබඩු වගාව සමඟ බැඳුණු කෘෂි සංචාරක ව්‍යාපාරය**

පොහොසත් කෘෂිකාර්මික උරුමයන් සඳහා ප්‍රසිද්ධ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ පිහිටා ඇති මාතලේ දිස්ත්‍රික්කය තුළ කෘෂි සංචාරක ව්‍යාපාර උප කාණ්ඩයක් ලෙස කුළුබඩු වගාව සමඟ සංචාරක ව්‍යාපාරය හඳුනාගෙන තිබේ. මාතලේ දිස්ත්‍රික්කයේ කුළුබඩු උද්‍යාන කලාපය කෘෂි සංචාරක අංශයේ සැලකිය යුතු කොටසක් බවට පත්ව හමාර ය. කවුඩුපැලැල්ල, උඩුදෙණිය, මඩවල උල්පත, දිබුලගමුව, කොහොළාංවෙල හා කවටයාඅමුණ යන ප්‍රදේශ ඔවුන්ගේ කුළුබඩු වගාව සඳහා විශේෂයෙන් ප්‍රමුඛ වූ ප්‍රදේශ වේ. ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගන්නා කුළුබඩු උද්‍යාන 22 ක් මෙම අධ්‍යයනය සඳහා යොදාගත් අතර මාතලේ කුළුබඩු උද්‍යාන මඟින් සංචාරකයන් ට කුළුබඩු වගා කිරීමේ ක්‍රියාවලිය අත්විඳීමට හා සාම්ප්‍රදායික ක්‍රම, ගොවිතැන් පිළිවෙත් පිළිබඳව ඉගෙනීම ට අවස්ථාවක් ද ලබාදේ. මෙයට විවිධ භාෂාවලින්



## දේශීය ශාක හා කුළුබඩු යොදා ගනිමින් ආයුර්වේද ප්‍රතිකාර හා සම්බාහනය ද නරඹන්නන්ට අත්විඳිය හැකි ය.

කුළුබඩු වගා හා කුළුබඩු හා ඖෂධ පැළෑටිවල භාවිතයන් පැහැදිලි කරන මඟ පෙන්වන්නන් සහභාගීත්වයෙන් සිදුකරන චාරිකා ද ඇතුළුව කුළුබඩු උද්‍යානය සංචාරකයින් සඳහා විවිධ වූ ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි. දේශීය ශාක හා කුළුබඩු යොදා ගනිමින් ආයුර්වේද ප්‍රතිකාර හා සම්බාහනය ද නරඹන්නන්ට අත්විඳිය හැකි ය. උද්‍යානයේ අවන්හලේ සාම්ප්‍රදායික ක්‍රම මඟින් පිළියෙල කළ දිවා ආහාරය පිරිනමනු ලැබේ. එසේ ම, කොතලහිඹුටු ජෝගුව වැනි දේශීය භාණ්ඩ වෙළෙඳ කුටිවලින් මිල දී ගැනීමටත්, ආයුර්වේද හා කුළුබඩු නිෂ්පාදනය සාම්ප්‍රදායික ව සාදන ආකාරය, ඒ ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව නරඹන්නට ඉගෙනීමට ද අවස්ථාව සකසා දී ඇත. ප්‍රධාන වශයෙන් මාතලේ අලුවිහාරය, නාලන්දා ගෙඩිගේ, රිවස්ටන්, දඹුලු විහාරය හා සීගිරිය ඇතුළු ව සාංචාරක ආකර්ෂණය සහිත ස්ථාන කිහිපයකට ම නිවහන බවට මාතලේ දිස්ත්‍රික්කය පත් ව තිබේ. මෙම සංචාරකයින් අතර ප්‍රසිද්ධ ස්ථාන නැරඹීමට පැමිණෙන විදේශීය මෙන් ම දේශීය සංචාරකයින් ද මෙම කුළුබඩු උද්‍යාන නැරඹීම තම සංචාරයේ කොටසක් කරගෙන සිටියි.

මෙම අධ්‍යයනයේ සොයා ගැනීම්වල ට අනුව, අධ්‍යයන ප්‍රදේශයේ කුළුබඩු උද්‍යාන හිමියන්ගේ සමාජ -ආර්ථික තොරතුරු පිළිබඳව සැලකීමේ දී උද්‍යාන හිමියන්ගේ වයස් ව්‍යාප්තිය පෙන්නුම් කරන්නේ බහුතරය වැඩිහිටි වයස් කාණ්ඩයට අයත් බවයි. එනම් 46%ක් වයස අවුරුදු 45-54 වයස් පරාසය තුළ ට වැටෙන අතර අවුරුදු 65ට අඩු හා ඊට වැඩි පිරිස 5% ක් වේ. වයස අවුරුදු 35ට අඩු කුළුබඩු උද්‍යාන හිමියන් අධ්‍යයන ප්‍රදේශයේ නොමැති බැවින් කුළුබඩු සංචාරක ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් මැද වයසේ සිට වැඩිහිටි පුද්ගලයින් සිදු කරන බැව් දැකිය හැකි ය. කුළුබඩු උද්‍යාන හිමියන්ගෙන් 73%ක් කෘෂි සංචාරක ව්‍යාපාරයේ සක්‍රිය ව නිරත වන්නා වූ හෙයින් මාතලේ දිස්ත්‍රික්කයේ කුළුබඩු සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින අයගේ බහුතරයකගේ ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස කෘෂි සංචාරක ව්‍යාපාරය සිදු කරන බැව් අනාවරණය විය. අධ්‍යයන ප්‍රදේශයේ කුළුබඩු සමඟ කෘෂිකාර්මික සංචාරක ව්‍යාපාරයේ නියැළී සිටින පුද්ගලයින් අතර හිමිකරුවන්ගෙන් 27% ක් මසකට රු.100,000 සිට 200,000 දක්වා ඉපැයීමක් කරන අතර 45%ක් කෘෂි සංචාරක කර්මාන්තයෙන් මාසික ව රු.200,000/- ඉක්ම වූ ආදායමක් උපයා ගනු ලබයි.

සමීක්ෂණ දත්තවලින් පෙන්නුම් කරන්නේ කුළුබඩු උද්‍යාන හිමියන්ගෙන් 77% ක ට තම උද්‍යාන සඳහා භාවිතා කිරීමට ඉඩම් හිමි බවයි. අධ්‍යයන ප්‍රදේශයේ ඉඩම් පරිහරණය ප්‍රායෝගික ව සිදු නොවන අතර ඉඩම් හිමිකමේ ප්‍රමාණය සැලකිය යුතු ලෙසින් වෙනස් වේ.

එසේ ම, කුළුබඩු උද්‍යාන හිමියන්ගෙන් 48% ක් කාබනික ගොවිතැන සිදු කරන්නා වූ අතර 52%ක් ඒකාබද්ධ ගොවිතැන් පිළිවෙත් කෙරෙහි අවධානය යොමු කොට සිටියි.



මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ ආකාරය ට මසක ට කුළුබඩු උද්‍යාන නැරඹීම ට පැමිණෙන සංචාරකයන්ගෙන් ප්‍රතිචාර දැක් වූ සංඛ්‍යාවෙන් 59% ක් පෙන්වා දී ඇත්තේ සංචාරකයින් 100 ක ට වැඩි පිරිසක් මෙම සංචාරක කර්මාන්තය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන බවයි. එසේ ම, සමීක්ෂණ දත්තවල ට අනුව සංචාරකයින් පැමිණෙන ප්‍රධාන රටවල් අතර ට චීනය, ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, ඉන්දියාව හා රුසියාව යන රටවල් අයත් වේ.

- **කුළුබඩු උද්‍යාන හිමියන් මුහුණ දෙන ගැටලු**



මාතලේ කෘෂි සංචාරක ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී මුහුණ දෙන ගැටලු රැසක් අධ්‍යනයේ දී හෙළි විය. සමීක්ෂණයේ දී ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 32%ක් විසින් ප්‍රධාන බාධකයක් ලෙසින් හඳුනාගෙන ඇත්තේ නියාමන ගැටලු ය. තවත් 29%ක් දක්වා ඇති ආකාරයට උද්‍යාන හිමියන් ට පවතින මූල්‍යමය බාධාවන් ද සැලකිය යුතු මට්ටමකින් පවතී. එසේ ම, අලෙවිකරණ අභියෝග 18%ක ගෙන් සටහන් වූ අතර ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 7%ක් කෘෂි සංචාරක ව්‍යාපාරය පිළිබඳ දැනුම හා කුසලතා නොමැතිකම, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකම හා මූලික ආයෝජන අවස්ථා බාධක ලෙසින් සඳහන් කර ඇත. කෘෂි සංචාරක සේවා සම්බන්ධයෙන් සංචාරකයන්ගේ තෘප්තිමත් බව පිළිබඳ රැස් කරන ලද දත්තවල ට අනුව, කෘෂිකාර්මික සේවා පිළිබඳ සංචාරක අතෘප්තිය සඳහා බලපාන ප්‍රධාන සාධකය වන්නේ අලෙවි සැල්වල පවතින මිල අධික නිෂ්පාදනයන් ය. ඊට අමතර ව, උද්‍යාන වල පිරිසිදුකම, සනීපාරක්ෂක පහසුකම්වල ඇති අඩුපාඩු, නිෂ්පාදන තම රටවල් වෙත රැගෙනයාමේ දී සිදුවන නීතිමය ගැටළු සහ සීමා කිරීම් මෙන් ම පාරිභෝගික සේවා මට්ටම ද සැලකිය යුතු ලෙසින් කෘෂි සංචාරක සේවා සම්බන්ධයෙන් සංචාරකයන්ගේ අතෘප්තියට හේතු වී තිබේ. මෙම අධ්‍යයනයේ දී කුළුබඩු සමඟ සංචාරක ව්‍යාපාරය සෘජු ව සම්බන්ධ නො වුවත්





වක්‍රාකාර ව මේ හා සම්බන්ධ වන පාර්ශ්වකරුවන් ද මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. මේ අතුරින් ප්‍රධාන පාර්ශ්වකරුවන් වන්නේ දැනට තම ඉඩම්වල කුළුබඩු වගාකරන වගාකරුවන් වේ. මෙම ගොවි මහතුන්ගේ 40%ක් පමණ තම නිෂ්පාදන, කුළුබඩු උද්‍යානවල ඇති අලෙවිසැල්වල ට ලබාදෙන අතර වැඩි ප්‍රමාණයක් මාතලේ නගරයේ ඇති කුළුබඩු මහාපරිමාණයේ එකතු කරන ව්‍යාපාරිකයින් හට ලබාදෙයි. මෙම වගාකරුවන් ට ඇති ප්‍රධාන ගැටලු වන්නේ තම වගාව වැඩිදියුණු කරගැනීමට ඇති මූල්‍යමය ගැටලු හා කුළුබඩු මිල ස්ථාවර නොවීම යනාදියයි. මෙම කුළුබඩු වතු හිමියන්ගෙන් බහුතරයක් තම වත්ත තුළ කෘෂි භාණ්ඩ සංචාරක ව්‍යාපාරය ඇරඹීම ට කැමැත්තක් පළ කළේ ය. තව ද, මෙම සංචාරක ව්‍යාපාර ආරම්භය ට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, මෙම සංචාර ව්‍යාපාරය ආරම්භය ට අවශ්‍ය මූලික දැනුම ඔවුන් විසින් ඉස්මතු කළ ගැටලු වේ.

- **කෘෂි සංචාරක ව්‍යාපාරයේ ප්‍රගමනය ට ගත හැකි ක්‍රියාමාර්ග**

මෙම පර්යේෂණයේ දී හඳුනාගන්නා ලද ගැටළු නිරාකරණය කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගැනීම වඩාත් යෝග්‍ය වේ. එහි දී, කෘෂිකාර්මික අංශය හා සම්බන්ධ රාජ්‍ය ආයතන ගොවි ප්‍රජාව සමඟ සෘජුව කටයුතු කරමින්, ඔවුන්ට පවතින මූලික ගැටලු හා නව අදහස් හඳුනා ගනිමින්, ඒවාට යෝග්‍ය පරිදි සැලසුම් ක්‍රියාත්මක කිරීම සිදු කළ හැකි ය. එසේ ම, කෘෂිකාර්මික ප්‍රජාව ට මෙන් ම උද්‍යාන හිමියන් ට අවශ්‍ය දැනුම හා මඟපෙන්වීම නිසියාකාර ව සිදු කිරීම ද ප්‍රධාන වශයෙන් සිදු කළ යුතු ව ඇති කාරණාවකි. කෘෂිකාර්මික සංචාරක ව්‍යාපාරය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට දේශීය හා විදේශීය සංචාරකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් රට තුළ ක්‍රියාත්මක කිරීම තුළින් ද පවතින තත්ත්වයට වඩා තවත් යහපත් තත්ත්වයක ට කෘෂි සංචාරක ව්‍යාපාර ඉදිරියට ගෙන යාමට අවස්ථා සැලසෙනු නො අනුමාන ය. සමහර ආසියාතික රටවල් මෙම මූලධර්මය යොදා ගනිමින් විශාල ලෙස විදේශ විනිමය උපයයි. උදාහරණ ලෙස මැලේසියාව, තායිලන්තය, ජපානය, මියන්මාරය, කොරියාව සහ වියට්නාමය උදාහරණ සපයයි. ඉහත සඳහන් ආසියාතික රටවල් මෙන් ම කෘෂි ජෛව විවිධත්වයෙන් පිරිපුන් රටක් වන ශ්‍රී ලංකාවේ මෙම කෘෂි සංචාරක ව්‍යාපාරය දියුණු කර ගැනීමට අවශ්‍ය මූලික සාධකය වන ජෛව විවිධත්වයෙන් පරිපූර්ණ වූ රටකි. එබැවින් මෙම ස්වභාවික සම්පත් කළමනාකරණය නිසි ලෙස සිදු කර කෘෂිකර්මාන්තය සමඟ සංචාරක ව්‍යාපාරය ඒකාබද්ධ ව ගමන් කරවීමට කටයුතු කළ යුතු ය. මෙලෙස කෘෂිකර්මාන්තය සමඟ සංචාරක ව්‍යාපාරය සම්බන්ධ කර ගැනීමෙන් ගොවිජනතාවගේ ජීවනෝපාය ඉහළ නංවාගැනීමේ කදිම විකල්ප මාර්ගයක් වනු නො අනුමාන ය.





**ජී.වී. නොරිකා අයෝමි**

**පර්යේෂණ නිලධාරිනී,**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.**

# කෘෂි-සංචාරක ව්‍යාපාරයේ සාර්ථක කතාවක්, දඹුල්ල ප්‍රදේශයෙන්



කෘෂි සංචාරක ව්‍යාපාරය, වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ වඩාත් ප්‍රචලිත සහ වර්ධනය වෙමින් පවතින සංචාරක ක්ෂේත්‍රයකි. ශ්‍රී ලංකාවේ ස්වාභාව සෞන්දර්ය, ජෛව විවිධත්වය, කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මෙන් ම ගොවීන්ගේ සම්ප්‍රදායික ජීවන අත්දැකීම් සංචාරක කර්මාන්තය සමඟ ඒකාබද්ධ කර ගැනීම, කෘෂි සංචාරක ව්‍යාපාරයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. ශ්‍රී ලාංකීය ගොවි ජනතාව ට සම්ප්‍රදායික ගොවිතැනින් ඔබ්බට ගොස් තම එදිනෙදා සිදුකරන වගා කටයුතුවලින් වඩාත් ලාභ ප්‍රයෝජන උපයා ගැනීම සඳහා කෘෂි සංචාරක ව්‍යාපාරය අත්වැල් සපයයි. දෙස් විදෙස් සංචාරකයින් කෘෂිකර්මය වෙත ආකර්ෂණය කර ගනිමින් ඔවුනට ද එම ක්‍රියාකාරකම්වල නිරත වීමට අවස්ථා උදා කර දීම මෙම ව්‍යාපාරය වඩාත් සාර්ථක වීමට හේතු වන කාරණයකි. මෙහි දී, ගොවීන් ට අමතර ආදායමක් ලැබීම, ඔවුන්ගේ සංචාරක කුසලතා සංවර්ධනය වීම සහ වැඩි දියුණු කළ ග්‍රාමීය යටිතල පහසුකම් ඇති වීම මේ හරහා ලැබෙන ප්‍රයෝජන කිහිපයකි. එසේ ම, සංචාරකයින්ට ද අද්විතීය මට්ටමේ කෘෂිකාර්මික අත්දැකීම්, අධ්‍යාපනික දැනුම මෙන් ම, වඩාත් පුළුල් ලෙස සංස්කෘතික අවබෝධයක් ලබා ගැනීමට ද අවස්ථාව උදා වේ.

කෘෂි සංචාරක ව්‍යාපාරය ක්‍රමයෙන් දියුණුවෙමින් පවතින අවස්ථාවක වඩාත් සාර්ථක ලෙස මෙම ව්‍යාපාරයේ නිරත වන ශ්‍රී ලංකාවේ තරුණ ගොවි මහතකුගේ සාර්ථක කතාවක් ගොවි ජනතා සඟරාව තුළින් මෙලෙස ඉදිරිපත් කෙරේ. ඔහු නමින් ප්‍රදීප් කුමාර වන අතර වයස අවුරුදු 35 කි. ප්‍රදීප් මහතා දඹුල්ල පන්නම්පිටිය නම් ඉතාමත් සුන්දර ගම්මානයේ ජීවත් වේ. ඔහුගේ පියා අතීතයේ සිට ප්‍රධාන රැකියාව ලෙස ගොවිතැන සිදු කරන අතර මව එයට පූර්ණ සහයෝගය දක්වන්නී ය. ප්‍රදීප් මහතාගේ පියා සතුව අක්කර දෙකක පමණ කුඹුරු ඉඩමක් ද අක්කර තුනක පමණ ගොඩ ඉඩමක් ද පවතී. මෙම සියලුම ඉඩම් පිහිටා ඇත්තේ ඔවුන් ජීවත් වන නිවස අවට සීමාවේ ය. ප්‍රදීප් මහතා තම පියා සමඟ කුඩා කල සිට ම ගොවිතැන් කටයුතුවල නිරත වේ. ඔවුන් විසින් ප්‍රධාන වශයෙන් ම මෑ, තක්කාලි, දඹල, පතෝල, රාබු, වැටකොළු, නෝකෝල්, ලොකු ළූණු, කෙසෙල්, ගස්ලබු සහ අඹ වැනි එළවළු සහ පලතුරු බෝග ගොඩ ඉඩම්වල වගා කරන අතර කුඹුරු ඉඩම්වල වී වගාව සිදු කරනු ලබයි.

ප්‍රදීප් මහතා, පියා සමඟ වගා කටයුතුවල නියැළෙන අතරතුර තම අධ්‍යාපන කටයුතු ද මැනවින් සිදු කරන ලදී. උසස් පෙළ විභාගයෙන් පසුව, ඔහුට කණ්ඩලම හෝටලයේ මාස 3ක් වැනි කෙටි කලක පුහුණු වැඩසටහනක් සඳහා සහභාගී වීමට අවස්ථාව උදා වෙයි. මෙම කාල සීමාව තුළ ඔහු ලබා ගත් අත්දැකීම් අනාගතයේ දී ඔහුට තම ජීවිතය වෙනස් කර ගන්නට අවස්ථාව උදා කර දී තිබේ. සංචාරක ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අදහස ඔහු තුළ මුල් බැස ගත්තේ ඔහු කණ්ඩලම හෝටලයේ පුහුණු වන කාලය තුළ දී ය. එම අදහස ඔහු තවදුරටත් වෙනස් කර ගනිමින් කෘෂි-සංචාරක ව්‍යාපාරයක් බවට පත් කර ගත්තේ ඉන් වසර කිහිපයකට පසුව ඔහු රැකියාව ලෙස ගුරු වෘත්තියේ නියැළෙමින් සිටින කාලයේ දී ය. ප්‍රදීප් මහතා ප්‍රථමයෙන් තම නිවසේ ම එක් කාමරයක් අලුත්වැඩියා කොට සංචාරක ව්‍යාපාරය ට ප්‍රවේශය සකසා ගන්නා ලදී. ඔහු සංචාරකයන් සඳහා අවශ්‍ය අවම පහසුකම් සහිත ව මෙම ප්‍රථම කාමරය ඉදි කර ඇත. ඔහුගේ නිවසට පැමිණි පළමු සංචාරකයා නෙදර්ලන්ත ජාතිකයෙකි.

සංචාරකයින් තම නිවසට පැමිණීම සඳහා පොළඹවා ගැනීම ට ඔහු භාවිතා කළ ප්‍රබල කාරණය වන්නේ ඔවුන්ගේ සම්ප්‍රදායික ගොවිතැනයි. එසේ ම, මනරම් කඳු පන්තියකින් වට වූ ස්වභාවික දිය පහරවල් සහිත ඔහුගේ ගම්මානය ද සංචාරක කර්මාන්තය සඳහා ඉතාමත් යෝග්‍ය වේ. සීගිරිය, දඹුල්ල විහාරය මෙන් ම පිදුරංගල වැනි සංචාරක ස්ථාන නැරඹීමට පැමිණෙන සංචාරකයන් ඔවුන්ගේ නවාතැන් පහසුකම් සඳහා වෙනස් අත්දැකීමක් ලබා ගැනීමට ප්‍රදීප් මහතාගේ නිවසට පැමිණේ.





ප්‍රදීප් මහතාගේ නිවසට පැමිණෙන සංචාරකයින් හට ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය පිළිබඳ ඉතා පුළුල් අවබෝධයක් ලබා ගැනීම ට අවස්ථාව උදා වේ. ප්‍රථමයෙන් ම ඔහු තම සංචාරකයින් සමඟ කෘෂි බෝග වගා කර ඇති ඉඩම්වල ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරයි. එම චාරිකාව අතරතුර ඒ එක් එක් බෝග වර්ග සහ ඒවා වගා කරන ආකාර පිළිබඳ ඔවුන්ට පැහැදිලි කරයි. අනෙක් කාරණාව නම් ඔහු තම සංචාරකයින් ගොවිතැන් කටයුතු සඳහා හවුල් කර ගැනීමයි. ඔහු සංචාරකයින් ට වගාව පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙයි. කුඹුරු වගා කිරීමේ දී සංචාරකයින් කුඹුරට බැස ඉතාම විනෝදයෙන් ඒ කටයුතුවලට සහාය දක්වයි. තව ද, එළවළු බෝග සිටුවීම, බිම් සකස් කිරීම, අස්වැන්න නෙලා ගැනීම වැනි විවිධ අවස්ථාවල දී සංචාරකයන්ගේ පැමිණීම අනුව ඔවුන්ට ඒ අත්දැකීම ලබා ගැනීමට අවස්ථාව උදා වේ.

සංචාරක ආකර්ෂණය දිනා ගත් තවත් එක් වගා ක්‍රමයක් වන්නේ කාබනික වගාවයි. ප්‍රදීප් මහතා ඔහුගේ වගා බිම්වලින් යම් ප්‍රදේශයක් කාබනික වගාව සඳහා වෙන් කර ඇත. ඔහු ඒ සඳහා කාබනික ක්‍රම (විශේෂයෙන් කාබනික පොහොර, කාබනික පළිබෝධ පාලන ක්‍රම) භාවිතා කරයි. බොහෝ දුරට, සියයට සියයක් ම කාබනික ක්‍රම අනුගමනය නො කළත්, මෙය එක්තරා ආකාරයක ආදර්ශනයක් ලෙස භාවිතා කරයි. ඉතාමත් දක්ෂ ගොවි මහතෙක් වන ප්‍රදීප් මහතාගේ පියා අඛණ්ඩ ව තම ගොවිතැන් කටයුතු සිදු කරගෙන යයි. කාබනික වගාව ට ඔහු ද වැඩි උනන්දුවක් දක්වයි.

ප්‍රදීප් මහතාගේ කෘෂි සංචාරක ව්‍යාපාරයේ සුවිශේෂී අංගයක් වන්නේ සංචාරකයින්ට අවශ්‍ය ආහාරපාන සියල්ල තම මව විසින් සකස් කර දීමයි. ඔවුන් විසින් ඉතාමත් සුහදශීලි ලෙස සංචාරකයින්ට සංග්‍රහ කරනු ලබයි. ඔවුන් තම සංචාරකයින්ට ප්‍රධාන වශයෙන් ම ලබා දෙන්නේ දේශීය ආහාර වර්ගයන් ය. විශේෂයෙන් ඔහුගේ ගෙවත්තෙන් ම නෙලා ගන්නා එළවළු සහ පලතුරු වර්ගයන් ය. ඇතැම් විට ආහාරපාන සකස් කිරීම සඳහා සංචාරකයින්ට ද අවස්ථාව සලසා දෙයි. මෙය ඔවුන්ට ඉතාමත් නැවුම් මෙන් ම විනෝදකාමී අත්දැකීමකි. කාබනික එළවළු සහ පලතුරු පමණක් යොදා ගනිමින් ද, සකස් කළ විශේෂ ආහාර වට්ටෝරුවක් ඔවුන්ගේ ආහාර ලැයිස්තුවේ පවතී. මේ සඳහා සංචාරකයින්ගේ විශේෂ ඉල්ලුමක් ඇත.

ප්‍රදීප් මහතාගේ නිවසට පැමිණෙන සංචාරකයින් හට ඔහුගේ ගම්මානයේ සිරි නැරඹීම සඳහා ද අවස්ථාව උදා වේ. බොහෝ විට ඔවුන් ගමේ පාර දිගේ වෙල් මැද්දෙන් අවට සිරි නරඹමින් ගමන් කරන්නේ ඉතාම විනෝදයෙනි. ඒ යන අතරතුර ඔවුනට ගම්වැසියන් මුණ ගැහෙන අතර ඔවුන්





සමඟ ද සුහදශීලි පිළිසඳරෙහි යෙදෙමින් මෙම චාරිකාව සිදු කරයි. මෙය ගම් වැසියන්ට ද ඉතාමත් වටිනා මෙන් ම වෙනස් ම අත්දැකීමකි.

ප්‍රදීප් මහතා මේ වන විට තම ගම්මානය තුළ ප්‍රජා මූලික සංචාරක ව්‍යාපාරය සඳහා අවස්ථාව උදා කර දී තිබේ. ඔහු තම සංචාරකයින් ගම තුළ සහ අවට නගරවල සංචාරය කිරීමේ දී අවශ්‍ය ප්‍රවාහන පහසුකම්, තම ගම්වැසියන්ගෙන් ලබා ගනියි. එසේ ම, ගම්වැසියන් සංචාරක මඟ පෙන්වන්නන් ලෙස යොදා ගනියි. මේ නිසා, ගමේ ප්‍රජාවට ද අමතර ආදායම් උපයා ගැනීමට අවස්ථාව සැලසේ. ප්‍රදීප් මහතාගේ මනා නායකත්ව සහ සන්නිවේදන කුසලතා නිසා ඔහු මේ වන විට තම සංචාරකයින් සමඟ සමාජ ව්‍යාපෘති කිහිපයකට ද සම්බන්ධ වී සිටියි. එහි දී ප්‍රධාන ව්‍යාපෘතිය වන්නේ තම ගම්මානය අවට ඇති අඩු පහසුකම් සහිත පාසල්වල ට මෙන් ම, පාසැල් දරුවන්ට උපකරණ ලබාදීමයි. තව ද, පන්සල්වල ට ආධාර සැපයීම වැනි කටයුතු ද මෙම සමාජ ව්‍යාපෘති හරහා සිදු කරයි. විශාල පරිමාණයේ ව්‍යාපෘති නොවුණ ද මෙවැනි කුඩා ව්‍යාපෘති හරහා ප්‍රදීප් මහතා තම රටට ද ඉතා අනඟි මෙහෙයක් ඉටු කරයි. ඔහු මේ සියල්ල සිදුකරන්නේ සිය ගුරු වෘත්තියේ වැඩ කටයුතු ද සිදු කරමිනි.

වසර හතකට පමණ පෙර එක් කාමරයකින් ආරම්භ කළ ප්‍රදීප් මහතාගේ කෘෂි-සංචාරක ව්‍යාපාරය වර්තමානය වන විට කාමර දහයකින් යුක්ත වේ. එහි විවිධ මට්ටමේ පහසුකම් සහිත වායු සමනය කරන ලද කාමර ද ඇත. ඔහුගේ සංචාරක නිවාසයේ කාමර ඒවාට අවේණික සුන්දරත්වයකින් යුක්ත වේ. බොහෝ විට, මෙම කාමර වගාබිම් ඉදිරිපිට ඉදිකර ඇත. සංචාරකයින් වගා භූමි දෙස බලමින් ඒවායේ සුන්දරත්වය විඳිමින් කාලය ගත කරයි. මේ වන විට ලෝකයේ විවිධ රටවලින් ඔහුගේ නිවසට සංචාරකයින් පැමිණ ඇත. විශේෂයෙන් ජර්මනිය, ඇමරිකාව, ස්විස්ටර්ලන්තය, නෙදර්ලන්තය, ඔස්ට්‍රියාව, ඕස්ට්‍රේලියාව, එංගලන්තය සහ බෙල්ජියම වැනි රටවල සංචාරකයින් බහුලව පැමිණ තිබේ. එසේ ම, මේ වන විට ඔහුගේ නිවස ඉදිරිපස විශාල පිහිනුම් තටාකයක් ද ඉදි කර ඇත. මේ නිසා සංචාරකයින් රිසි සේ පිහිනුම් තටාකයේ විනෝද වෙමින් පිහිනුම් කටයුතුවල නිරත වේ. සංචාරකයින් ට පමණක් නොව ගමේ කුඩා දරුවන්ට ද පිහිනුම් තටාකයේ විනෝද වීම සඳහා අවස්ථාව ලබා දී තිබේ. ප්‍රදීප් මහතා ඉතාමත් සුහදශීලි පුද්ගලයෙකි. ඔහු මෙම ව්‍යාපාරය තම බිරිඳ, මව, පියා ඇතුළු පවුලේ සියලුම දෙනාගේ සහයෝගය ඇතිව සිදු කරයි.





2019 වර්ෂයේ දී කොරෝනා වසංගතය පැමිණීමත් සමඟ ඔහුගේ සංචාරක ව්‍යාපාරය මුළුමනින් ම බිඳ වැටුන ද වර්තමාන වන විට ඔහු නැවත සාර්ථක තත්ත්වයට පත් වී සිටියි. ඔහුගේ උනන්දුව, ධෛර්යය හා නොපසුබට උත්සාහය මෙයට ප්‍රධාන හේතුව වේ. ප්‍රදීප් මහතා කෙතරම් සාර්ථක ලෙස සංචාරක ව්‍යාපාරය සිදු කළ ද, ඔහු ඔහුගේ ආරම්භය අමතක කොට නැත. තවමත් ඔහු ගොවිතැන් කටයුතුවල නියැළී සිටියි. ඊට හේතුව සංචාරකයන් ආකර්ෂණය කරගැනීමේ මුලික සාධකය වන්නේ ඔවුන්ගේ කෘෂිකර්මාන්තය වන බැවිනි. ඔහුගේ නිවසට පැමිණෙන සියලුම සංචාරකයින් ස්වභාවික ග්‍රාමීය පරිසරය සහ කෘෂිකර්මාන්තය ට ලැදි පිරිසක් වේ.

වර්තමානය වන විට ප්‍රදීප් මහතා සිය ගුරු ජීවිතයට සමු දී ඇත. දැන් ඔහු පූර්ණ කාලීන ව සංචාරක කර්මාන්තයේ නියැළී සිටියි. ප්‍රදීප් මහතා පවසන ආකාරයට  මේ වනවිට ඔවුන්ගේ පවුලේ ආර්ථික මට්ටම පෙරට වඩා බොහෝ සෙයින් ඉහළ මට්ටමක පවතී. සාම්ප්‍රදායික ලෙස ගොවිතැන් කටයුතුවල පමණක් නිරත වී සිටි කාලයට වඩා මේ වන විට ඔවුන් බොහෝ ආර්ථික මෙන් ම, සමාජයීය මට්ටමින් ද ඉදිරියට පැමිණ සිටියි. විදේශිකයන් සමඟ ඔවුන් ගතකරන ජීවිතය ඔවුනට දැන් වෙනස් ම අත්දැකීමක් බවට පත් වී හමාර ය. ප්‍රදීප් මහතාගේ බලාපොරොත්තුව ඔහුගේ කෘෂි-සංචාරක ව්‍යාපාරය තවදුරටත් දියුණු කර ගැනීමයි. ඒ කෙසේ වෙතත්, ඔහු කිසි දින තම ගොවිතැන අත නොහරිනු ඇත.




**දිනුෂා රත්නායක**

පර්යේෂණ නිලධාරිනී

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු**

**පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**